# ශ්‍රී ලංකාවේ නිදර්ශනාත්මක සිද්ධීන් දහයක් පිළිබඳ නැවත සමාලෝචනය: යුක්තිය තවදුරටත් යථාර්ථයක් නොවන්නේ ඇයි?

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2021 ජනවාරි

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටළු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වූ දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙනය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක භාජනය කරන, විකල්පයන් හඳුනාගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව

දූ.ක :+9411 2081384, +94112081385, +94112081386

ෆැක්ස් :+9411 2081388 Email: info@cpalanka.org

වෙබ් අඩවිය :www.cpalanka.org

විද්‍යුත් තැපෑල: info@cpalanka.org

ෆේස්බුක් :www.facebook.com/cpasl

ට්විටර්: @cpasl

# පිළිගැන්වීම

මෙම වාර්තාව, භවානි ෆොන්සේකා, චාර්යා සමරකෝන් සහ කුෂ්මිලා රණසිංහ විසින්  සිදුකළ පර්යේෂණයක් පදනම් කර ගනිමින් රචනා කරන ඇත. මෙ වාර්තාවට අදාල මූලික කෙටුම්පත් සම්බන්ධව අදහස් දැක්වීම ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් සිදුකරන ලදි. මෙම වාර්තාවෙහි පිටු සැකසුම අයෝධ්‍යා ගජනායක විසින් කර ඇත. තොරතුරු හා දැනුම බෙදාගැනීමෙන් මෙම පර්යේෂණය සඳහා සහාය ලබාදෙන ලද සියලුම පුද්ගලයන් වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය කෘතවේදීත්වය දක්වනු ලබයි.

# පටුන

1. පසුබිම .......... 4

2. ශ්‍රී ලංකාව තුළ වූ නිදර්ශනාත්මක සිද්ධීන් පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක්........ 7

3. ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ .......... 10

ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ .......... 10

ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ .......... 16

4. නිගමනය .......... 21

ඇමුණුම 1 - නිදර්ශනාත්මක නඩු දහයෙහි කාලරාමුව හා විස්තර .......... 22

## 1. පසුබිම

මෙම පර්යේෂණ වාර්තාවේ සාකච්ඡා කර ඇති නඩු ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ දෝෂ හා අප්‍රමාණවත්භාවයන් සංකේතවත් කරනු ලබයි. මෙවන් නඩු තුළින් යුක්තිය හා වගවීම පිළිබඳව වූ බහුවිධ පසුබෑම හා බාධාවන් පැහැදිලිව පෙන්නුම් කරනු ලබයි. මෙම නඩු බහුතරයක වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් දශකයකට වඩා වැඩි කාලයක් යුක්තිය අපේක්ෂාවෙන් සිටින අතර, ඒවායේ විමර්ශන නඩු පැවරීමේ අදියරන්හි ද මන්දගාමී ප්‍රගතියක් දක්නට ඇත. මෙම වාර්තාව තුළ සමාලෝචනය කරන ලද නඩු කිහිපය අනුව පෙනීයන්නේ ''ත්‍රිකුණාමළයේ 5 දෙනාගේ නඩුව'' සහ ජෝශප් පරරාජසිංහම් ඝාතනය වැනි නඩුවල චූදිතයන් නිදොස් කොට නිදහස් කර ඇති බවයි (මේ සම්බන්ධව පසුව වාර්තාවේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත).

මෙම සන්දර්භය තුළ වත්මන් රජය විසින් වගවීම හා මානව හිමිකම් පිළිබඳ පූර්ව කැපවීම පිළිබඳව පවතින සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ අරමුණ පැහැදිලි කර ඇත[1]. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 වන ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා වූ කැපවීම සඳහා 2015 දී ශ්‍රී ලංකා රජය විසින් සම අනුග්‍රහය දැක්වීය. එමෙන්ම 2017 සහ 2019 වර්ෂයන් හි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ තවත් යෝජනා දෙකකින් ශ්‍රී ලංකාවට ඒ සම්බන්ධයෙන් ඇති බැඳීම් අලුත් කරන ලදි.

මෙම යෝජනාවන් හරහා ශ්‍රී ලංකාව විසින් ''මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝණය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා විශේෂ අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම'' සඳහා කැපවී සිටින අතර බලයලත් නඩු පවරන්නන් සහ විමර්ශකයින් ඇතුළත්ව වෘත්ති පාර්ශවයන් වෙනුවෙන් පෙනීසිටින නීතිඥයන්, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ වෙනත් විදේශීය විනිසුරුවන්, විදේශ උපදේශක කාර්යාලයන් විසින් ශ්‍රී ලංකා අධිකරණ යාන්ත්‍රණයට සහභාගීවීමේ වැදගත්කම පිළිගන්නා ලදි.[2] එසේවුවද, එවැනි යාන්ත්‍රණයක් කිසිදු අවස්ථාවක ස්ථාපිත නොවූ අතර, වත්මන රජය එවන් අධිකරණ යාන්ත්‍රණයක් සඳහා වූ පූර්වයෙන් වූ බැඳීම් ද පැහැදිලිවම ප්‍රතික්ෂේප කර තිබේ.[3]

2019 නොවැම්බර් මස සිදු වූ ආණ්ඩුවෙහි වෙනස්වීමෙන් පසුව, යුධ අපරාධ, මානව හිමිකම් උල්ලංඝණ කිරීම් සහ වෙනත් බරපතල අපරාධ සම්බන්ධයෙන් වගවීම පිළිබඳ වත්මන් රජයේ ස්ථාවරය වෙනස්වී තිබේ. නව රජය පත්වීමෙන් පසු යෝජනාව සඳහා සම අනුග්‍රහය දැක්වීමෙන්

---

[1] අමාත්‍ය මණ්ඩල කාර්යාලය, 2020- 01-19, කැබිනට් තීරණ දැනුම්දීම පිළිබඳ මාධ්‍ය හමුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනාව 30/1,"ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" යොමුව http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=10425 2020 නොවැම්බර් 14 දින ප්‍රවේශ විය.

[2] ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්' ශ්‍රී ලංකාව: එක්සත් ජාතීන් සමග පවතින බැඳීම්වලින් ඉවත්වීම සම්බන්ධයෙන් මානව හිමිකම් කවුන්සිලය විසින් ඊට ශක්තිමත් ප්‍රතිචාර ඉල්ලා සිටින ලදි. යොමුව https://www.amnesty.org/en/latest/news/2020/02/sri-lanka-withdrawal-from-un-commitments-requires-robust-response-by-human-rights-council/ 2020 නොවැම්බර් 14 දින ප්‍රවේශ විය.

[3] එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාව වෙනුවෙන් වූ නිත්‍ය මෙහෙයුම, විදේශ සබඳතා ඇමති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් හමුවෙයි. යොමුව https://www.un.int/srilanka/news/foreign-relations-minister-meets-un-high-commissioner-human-rights 2020 නොවැම්බර් 14 දින ප්‍රවේශ විය.

සහ යෝජනාවේ ඇති බැඳීම්වලින් ඉවත්වීම සඳහා වූ රජයේ අභිප්‍රාය පිළිබඳ නිවේදනය කළ අතර ''රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පවත්නා යාන්ත්‍රණයන් සුදුසු පරිදි අනුවර්තනය කිරීම ඇතුළුව'' සියල්ල ඇතුළත් දේශීයව සැළසුම් කරන ලද ප්‍රතිසන්ධාන සහ වගවීමේ ක්‍රියාවලියක් තුළින් තිරසාර සාමය ළඟා කරගැනීම සම්බන්ධයෙන් වූ රජයේ කැපවීම ප්‍රකාශයට පත්කරන ලදි.

මානව හිමිකම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝණය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කරන ලද ශ්‍රී ලංකා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තා සමාලෝචනය, ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය තක්සේරු කිරීම සහ නව රජයේ ප්‍රතිපත්තියට අනුකූලව ඒවා ක්‍රියාත්මක කිරීමේ දී භාරදිය හැකි තත්ත්වයට පත්කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහාත් ශ්‍රේෂ්ඨාධිකරණ[4] විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් විමර්ශන කොමිෂන් සභාවක් පත්කිරීම මෙයට ඇතුළත් වේ.[5]

එමෙන්ම, විමර්ශන කොමිෂන් සභා සම්බන්ධයෙන් වූ පූර්ව අත්දැකීම් මගින් පෙන්නුම් කරනුයේ තිරසාර ප්‍රතිසන්ධානය සහ වගවීමේ ක්‍රියාවලීන් සැපයීමේ දී එය ඵලදායී නොවන බවත්, මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට රාජ්‍ය අනුග්‍රහය තිබෙන බවට ඉතා ප්‍රබල සාක්ෂි තිබෙන අවස්ථාවල දී පවා විරුද්ධවාදීන්ට එරෙහිව පක්ෂග්‍රාහී ප්‍රහාර දියත්කිරීමට හෝ විවේචන මඟහැරීමට මෙවලමක් වශයෙන් විමර්ශන කොමිෂන් සභා භාවිත කර ඇති බවයි.'[6]

තවද, ඔවුන් විසින් අපරාධ පරීක්ෂණයන්හි ප්‍රමාදයන් මෙන්ම සාක්ෂි විකෘති කිරීම් ද සිදුකර ඇති අතර ඒවායේ ප්‍රතිඵලයක් ලෙස වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට අදාළ ක්‍රියාවලිය වෙත සහභාගී වීමට නොහැකි අනර්ථකාරී පසුබිමක් නිර්මාණය කර ඇත. තව ද මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ වෙනත් බරපතල අපරාධ විමර්ශනය කිරීම සඳහා පත්කර ඇති මෙවන් කොමිෂන් සභා වාර්තාවල දක්වා තිබෙන්නා වූ ඕනෑම පසු විපරම් ක්‍රියාමාර්ගයක් හෝ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සීමිත තොරතුරු ප්‍රමාණයක් පමණක් පොදුවේ පරිශීලනය කිරීම සඳහා පවතී.[7]

එමෙන්ම, මෙම වගවීම සම්බන්ධ පූර්වයෙන් සිදුකරන ලද පූර්ව කැපවීම් අත්හැරීමත් සමඟම ගැටුම්කාරී කාල සමයන් හි බරපතල මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සම්බන්ධයන් චෝදනා

[4] මේ වන විට, කැබිනට් මණ්ඩලය දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීම සඳාහ වූ ජනාධිපති කොමිෂන් සභාව අනුමත කර ඇති අතර, මාධ්‍ය වාර්තාවලට අනුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) ජිනීවා හි ශ්‍රී ලංකාවේ නඩුව විභාගයට ගැනීමට දින කිහිපයකට පෙර ලක් රජයෙන් නිවේදනයක් අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 ප්‍රමුඛතා, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම, මැතිවරණ සහ නව කැබිනට් මණ්ඩලයක් පිහිටුවීම ආදී හේතු නිසා නව ආයතනය පිහිටුවීමට වසරකට ආසන්න කාලයක් ප්‍රමාද වී ඇති බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා පැවසීය. සන්ඩේ ටයිම්ස්, 'මානව හිමිකම් චෝදනා අධ්‍යයනය කිරීම සඳහා නව විමර්ශන කොමිෂන් සභාවක්, යොමුව http://www.sundaytimes.lk/210117/news/a-new-commission-of-inquiry-to-study-human-rights-allegations-429116.html> 2021 ජනවාරි මස 17 වන දින ප්‍රවේශ විය.
[5] ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩල කාර්යාලය, 2020 -02-09 දින, කැබිනට් තීරණ පිළිබඳ මාධ්‍ය හමුව, එක්ස් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යොජනාව 30/1, ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම, යොමුව http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=10425 2020 නොවැම්බර් 14 දින ප්‍රවේශ විය. ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය, වගවීම හා මානව හිමිකම් පිළිබඳ ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකාව කැපවී සිටී- අමාත්‍ය බන්දුල ගුණවර්ධන.
යොමුව <http://www.defence.lk/Article/view_article/894> 2020 නොවැම්බර් 14 දින ප්‍රවේශ විය.
[6] ග්‍රවුන්ඩ් විව්ස් 'ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිෂන් සභා සමග වූ ගැටළු සහගත අතීතය, අපි වැරදි නැවත නැවත සිදුකරනවා ද? https://groundviews.org/2018/03/19/sri-lankas-problematic-past-with-commissions-of-inquiry-are-we-repeating-mistakes/ 2021 ජනවාරි 16 සිට ප්‍රවේශ විය හැකි ය; විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය '2006 - 2012 දක්වා ශ්‍රී ලංකා රජය විසින් පත්කරන ලද විමර්ශන කොමිෂන් සභා සහ කමිටු ලැයිස්තුවක්,
[7] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය '2006 - 2012 දක්වා ශ්‍රී ලංකා රජය විසින් පත්කරන ලද විමර්ශන කොමිෂන් සභා සහ කමිටු ලැයිස්තුවක් (2006- 2013)' https://www.cpalanka.org/a-list-of-commissions-and-committees-appointed-by-gosl-2006-2013/ 2020 නොවැම්බර් 20 දින ප්‍රවේශ විය.

ලැබූ හෝ වැරදිකරුවන් වූ පුද්ගලයන් නිදොස් කොට නිදහස් කිරීම සහ ජනාධිපති සමාව ලබාදීම වැනි දෑ තුළින් මෑතකාලීනව එකී තත්ත්වය තවදුරටත් අධෛර්යයට පත්කිරීම හෝ ප්‍රතිනමනය කිරීමක් සිදුකර ඇති බව පෙනී යයි.[8] මීට අමතරව, ජෝශප් පරරාජසංහම් ඝාතනය වැනි සමහර නඩුවලදී නඩු පැවරීම අත්හිටුවීමට සහ චෝදනා අතහැර දැමීමට ද නීතිපතිවරයා තීරණය කර තිබේ.[9] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර දී, නීතිමය කටයුතු වලදී විශේෂයෙන්ම අපරාධමය කාරණා සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් භාවිත කරන ලද පුළුල් බලයේ ඇති ගැටළුකාරී තත්ත්වය ඉස්මතු කර ඇත.[10]

තවද, මෙම නඩුවල දී චූදිතයන් හෝ වැරදිකරුවන් වූවන් දේශපාලන හිංසනයන්ට ගොදුරු වූවන් ලෙස නිරූපණය කිරීමට ගත් උත්සාහයන් වගවීම හා යුක්තිය පසිඳලීම සඳහා දරනු ලබන උත්සාහයන් සම්බන්ධයෙන් තවදුරටත් බාධාවක් වී තිබේ.[11] අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ එවැනි විධායක මැදිහත්වීම් හේතුවෙන් නීතියේ ආධිපත්‍යය සහ අධිකරණයේ ස්වාධීනත්වය දැඩිලෙස සෝදාපාළුවට ලක්විය හැකි ය.[12]

මෙවන් අගතිගාමී ප්‍රවණතාවයන් සැළකිල්ලට ගනිමින්, මෙම වාර්තාව මඟින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය සුරක්ෂිත කිරීමට ඇති අඛණ්ඩ බාධක සංක්ෂිප්තව විමසා බලා ව්‍යුහාත්මක හා නීතිමය ප්‍රතිසංස්කරණය සඳහා සවිස්තරාත්මක නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරයන් සඳහා වන නිර්දේශයන් බොහෝ දුරට විමර්ශන සහ නඩු පැවරීම් කෙරෙහි අවධානය යොමු කරන නමුත් අධිකරණ පද්ධතියේ ප්‍රතිසංස්කරණ ද තීරණාත්මක පිළිගනී. වර්තමාන වාර්තාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින්,[13] පූර්වයෙන් ප්‍රකාශයට පත්කරන ලද කරුණු නැවත සළකා බලමින්, පෙර වාර්තාවේ දී ඉදිරිපත් කරන ලද ප්‍රතිසංස්කරණ සඳහා වූ පුළුල් යෝජනා තවදුරටත් පුළුල්ව ඉදිරිපත් කරනු ලබයි.

---

[8]ග්‍රවුන්ඩ් විව්ස්, ත්‍රිකුණාමලය 5 දෙනා සඳහා යුක්තිය ඉටුවීම ප්‍රතික‍ෂේප කරන ලදි. ලබාගත හැකි වනුයේ https://groundviews.org/2019/07/08/justice-denied-for-trinco-5/ 2020 නොවැම්බර් 20 දින සිට ප්‍රවේශ විය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, මිරුසුවිල් සංහාරයේ සමාව ශ්‍රී ලංකාවෙ නොපැහැදිලි යුක්තිය පෙන්නුම් කිරීම සඳහා වූ ගවේෂණය, <https://www.cpalanka.org/the-pardon-in-the-mirusuvil-massacresri-lankas-elusive-quest-for-justice/> වෙතින් ලබාගත හැකි ය.

[9] ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම, ශ්‍රී ලංකාව- වගවීම සහතික කිරීමට රජය අපොහොසත් විමේ නිදර්ශනය - යොමුව https://www.icj.org/sri-lanka-acquittal-emblematic-of-the-states-failure-to-ensure-accountability/ 2021 ජනවාරි 16 දින ප්‍රවේශ විය.

[10] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳ නැවත සිතා බැලීම - ප්‍රතිසංස්කරණ සඳහා අදහස්, යොමුව, https://www.cpalanka.org/rethinking-the-attorney-generals-department-in-sri-lanka-ideas-for-reform/ 2020 නොවැම්බර් 23 වන දින ප්‍රවේශ විය.

[11] විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය එදිරිව නීතිපති ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම **32/2020** https://www.cpalanka.org/centre-for-policy-alternatives-v-attorney-general-sc-fr-32-2020/

[12] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සුනිල් රත්නායක වෙත සමාව දීමට ගත් තීරණය අභියෝගයට ලක් කරන මූලික අයිතිවාසිකම් අයදුම්පතක්, යොමුව https://www.cpalanka.org/fundamental-rights-applicationschallenging-the-decision-to-pardon-sunil-ratnayake/ 2020 නොවැම්බර් 23 දින ප්‍රවේශ විය.

[13] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම, යොමුව https://www.cpalanka.org/the-needfor-accountability-in-sri-lankas-criminal-justice-system/ 2020 නොවැම්බර් 23 දින ප්‍රවේශ විය.

## 2. ශ්‍රී ලංකාව තුළ වූ නිදර්ශනාත්මක සිද්ධීන් පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක්

ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය විනිශ්චය පද්ධතිය මගින් යුක්තිය සහ වගවීම ලබාගැනීමේ දී සිදුවන ප්‍රමාදයන් සහ අධෛර්යයට පත්කිරීම් පෙන්වාදීම  සඳහා නිදර්ශනාත්මක නඩු දහයක් සමාලෝචනය කරනු ලබයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ විනිශ්චය පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරනු ලබන නිදර්ශනාත්මක නඩු ගණනාවක් අධ්‍යයනය කළ අතර යුක්තිය ඉෂ්ඨ කරගැනීමේ ප්‍රමාදයන් සහ පසුබෑමේ විවිධ පැතිකඩයන් කෙරේ අවධානය යොමුකරනු ලබන නඩු 10 ක් මෙම වාර්තාව සඳහා තෝරාගන්නා ලදි. තෝරාගන්නා ලද සිද්ධීන් හරහා විවිධ කාල පරාසයන් සහ භූගෝලීය ප්‍රදේශ, වින්දිතයන්ගේ සාමාජීය හා වෘත්තිමය තත්ත්වයන්  සහ විමර්ශණ කටයුතු සහ නඩු පැවරීම් ආදී කරුණු කෙරේ ද අවධානය යොමුකර ඇත.[14]

මෙම කොටස මගින් තෝරාගත් සිද්ධීන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලබා දේ. මෙම නඩු පිළිබඳ වැඩි විස්තර සඳහා ප්‍රසිද්ධියේ ලබාගතහැකි තොරතුරු මත පදනම්ව කාලරාමුවක් සහ එක් එක් සිද්ධියේ විස්තරයන් අන්තර්ගත ඇමුණුම I වෙත යොමුවන්න.[15]

### 1. ජෝෂප් පරරාජසිංහම් ඝාතනය,2005

පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝෂප් පරරාජසිංහම් ඝාතනය පිළිබඳ වූ නඩු කටයුත්ත විමර්ශනය හා නඩු පැවරීම් සම්බන්ධව දිගුකාලීන ප්‍රමාදයන්ට ඔවුන් මුහුණ දී ඇත. මෙම නඩුවේ දී අභියාචනාධිකරණය විසින් චූදිතයන්ට විරුද්ධව තිබූ පාපොච්චාරණ සාක්ෂි ලෙස අනනුකූල වන බව පෙන්වා දුන් අතර එකී තීරණයෙන් පසුව නීතිපතිවරයා විසින් නඩු විභාගය අත්හිටුවීමට තීරණය කරන ලද අතර විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කරන ලදි.[16]

### 2. “ත්‍රිකුණාමළයේ 5 දෙනාගේ නඩුව (පංච පුද්ගල ශිෂ්‍ය ඝාතනය)” 2006 වර්ෂයේ දී ත්‍රිකුණාමලයේ දී දෙමළ ශිෂ්‍යයන් පස් දෙනෙකු ඝාතනය කිරීම:

2006 වර්ෂයේ ජනවාරි 02 වන දින දමිළ සිසුන් පස්දෙනෙකු ඝාතනය කිරීම  සම්බන්ධයෙන් වන මෙම නඩුවේ දී දීර්ඝ කාලීන විමර්ශනයකින් හා නඩු පැවරීමෙන් පසුව සාක්ෂි ප්‍රමාණවත් නොවීම මත චූදිතයන් 13 දෙනාම නිදහස් කරන ලදි. දිවිගලවාගත් පුද්ගලයන් හා සාක්ෂිකරුවන් වෙත තිබූ බරපතල තර්ජන හේතුවෙන් මෙම නඩුව දිගුකාලීනව පරීක්ෂාවට භාජනය වූ අතර, එමගින් අවසාන වශයෙන් පවුලේ සාමාජිකයන් හට ලංකවෙන් පළායාමට සිදුවිය.[17]

---

[14] ශ්‍රී ලංකාවේ බොහෝ සංකේතාත්මක සිද්ධීන් රටේ යුක්තිය සමඟ ඇති විවිධ අභියෝග, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ ඇති අඩුපාඩු සහ පවතින දඬුවම් නොලැබීමේ ක්‍රමය පිළිබඳ නිදර්ශනයකි

[15] පොදුවේ පවතින සිද්ධීන් පිළිබඳ සීමිත තොරතුරු පවතින අතර, සිද්ධි වල ස්වභාවය මෙන්ම ඒවා සිදුවීමෙන් පසු සැලකිය යුතු කාලයක් ගතවීම ද තොරතුරු ලබා ගැනීම අභියෝගයක් කරයි.

[16] ඉදිරි ආර්ථිකය, අභියාචනාධිකරණ තීන්දුව මගින් පිල්ලෙයාන් නිදහස් කරන ලදී, යොමුව, https://economynext.com/pillayan-released-due-to-ca-decision-lawyer-77804/ 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශ විය.

[17] හියුමන් රයිට්ස් වොච්, ශ්‍රී ලංකාව, ත්‍රිකුණාමලය 5 දෙනාගේ පැහැරගැනීම සම්බන්ධයෙන් යුක්තියක් නොමැත, https://www.hrw.org/news/2019/07/08/sri-lanka-no-justice-trinco-5 2020 දෙසැම්බර් 15 වන දින ප්‍රවේශ විය.

### 3. ඇක්ෂන් අගේන්ස්ට් හන්ගර් සංවිධානයේ සේවකයන් ඝාතනය කිරීම,2006

නැවත නැවතත් සිදුකරන ලද ආරක්ෂණයන් ද නොසළකමින්, 2006 වර්ෂයේ අගෝස්තු 17 වන දින මුතූර් හි සිදුකරන ලද සහන සේවකයන් 17 දෙනෙකු වෙඩිතබා ඝාතනය කිරීම සම්බන්ධව වගකිව යුත්තන් නීතිය ඉදිරියට පමුණුවාලීමට අනුප්‍රාප්තික රජයන් අපොහොසත් වී තිබේ. මාධ්‍ය වාර්තා කරන ලද පරිදි නීතිපතිවරයා විසින් පොලීසිය වෙත මෙම නඩුවට අදාළ විමර්ශන වේගවත් කරන ලෙසට නියෝග කර ඇති නමුත් මෙම සිදුවීමට අදාළ විමර්ශනයන්ට අදාළ වැඩිදුර විස්තර මහජනයාට ලබාගත නොහැකි ය.

### 4. කීත් නොයාර් පැහැර ගැනීම, 2008 වර්ෂය

මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගෙන යාම සම්බන්ධයෙන් වූ නඩුවේ දීර්ඝ කාලීන ප්‍රමාදයක් පැහැදිලිව පෙන්නම් කරයි. ප්‍රධාන සාක්ෂිකරුවන් සහ සැකකරුවන් දේශපාලන හිංසනයන්ට ගොදුරු වූවන් ලෙස පෙන්වාදීමට ගත් උත්සාහයන් සමඟ මෑත දී එය වෙනස් වූ විපර්යාසයකට ලක්කර ඇත.

### 5. අතුරුදන් වූ එකොළහ, තරුණයන් 11 දෙනෙකු පැහැරගැනීම ,2008/09

කොළඹ කොටහේන හා තදාසන්න ප්‍රදේශ වල දී 2008 අගෝස්තු 25 සිට 2009 මාර්තු 21 දක්වා වූ කාලය තුළ තරුණයින් 11 දෙනෙකු පැහැරගෙන යාම සම්බන්ධයෙන් චෝදනා ලක්වූවන්ට එරෙහිව දීර්ඝකාලීන විමර්ශනවලින් අනතුරුව දශකයකට පමණ පසුව 2020 වර්ෂයේ නඩු පවරා ඇත. කෙසේ වුව ද, පසුගිය රජය (2015 - 2020) යටතේ රාජ්‍ය සේවකයන් හට දේශපාලන හිංසනය සිදුකරන ලද බවට වන චෝදනා විභාග කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (PCoI) විසින් මෙකී චෝදනා නතර කිරීම සඳහා ගන්නා ලද උත්සාහයන් හේතුවෙන් නඩුව ඉදිරියට පවත්වාගෙන යනු ඇත් ද යන්න පිළිබඳව සැළකිලිමත් වේ. මෙකී ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව ජනාධිපතිවරයා වෙත භාරදුන් නමුත් එහි සොයාගැනීම් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් මහජනයා වෙත ලබාගැනීමට අවකාශ නොමැත.[18]

### 6. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය, 2009

මෙම නඩුව සම්බන්ධයෙන් සඳහන් කිරීමේ දී, එය දශකයකට වැඩි කාලයක් පුරාවට ඒ සම්බන්ධයෙන් විමර්ශන හා නඩු පැවරීම්වල සැළකිය යුතු ප්‍රමාදයන් සහිත නඩුවක් වූ අතර යුක්තිය සහ වගවීම නොපැහැදිලි වූ තවත් අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි ය. දේශීය වශයෙන් පවතින යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයන් විසින් යුක්තිය පසිඳලීම සඳහා නියමාකාර ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් ඔහුගේ පවුලේ සාමාජිකයන් විසින් ඝාතනය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා සහාය ඉල්ලා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිල්ලක් ගොනු කරනු ලැබීය.[19]

[18] නිව්ස් ෆස්ට්, දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාවෙහි අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත භාරදීම, යොමුව https://www.newsfirst.lk/2020/12/08/final-report-by-pcoi-on-political-victimization-handedover-to-president/ 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශ විය.

[19] ග්ලෝබ් ඇන්ඩ් මේල් , ඝාතනයට ලක් වූ ශ්‍රී ලාංකික මාධ්‍යවේදියාගේ දියණිය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි කරයි. යොමුව, https://www.theglobeandmail.com/world/article-daughter-of-slain-srilankan-journalist-files-complaint-with-un-rights/> 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශ විය.

### 7. ප්‍රගීත් එක්නැළිගොඩ අතුරුදහන් කිරීම, 2010

සාක්ෂි අත්හිටුවීමට උත්සාහ කිරීම හේතුවෙන් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ අතුරුදහන්වීම පිළිබඳ පරීක්ෂණයේ ප්‍රමාදවීමක් හා මඟහැරීමක් තිබෙනු දක්නට ලැබේ. මෙහි දී වින්දිතයන් හා සාක්ෂිරුවන් බිය ගැන්වීම් මෙන්ම අදාළ චෝදනා ලත් පුද්ගලයින් එහි දුර්විපාක නොවිඳමින් සිටිනු ද දක්නට ලැබේ.

### 8. වසීම් තාජුඩීන් ඝාතනය,2012

රග්බි ක්‍රීඩක තාජුඩීන්ගේ මරණය හදිසි අනතුරක් ලෙස වසන් කිරීමේ මූලික උත්සායක් ගන්නා ලද අතර, අවසානයේ එකී ඝාතනය වසන් කිරීම සඳහා සම්බන්ධ වූ පුද්ගලයන් හට 2019 වර්ෂයේ චෝදනා ගොනු කරන ලදී.

### 9. වැලිකඩ බන්ධනාගාර සිදුවීම 2012

මෙම සිදුවීමේ දී 27 දෙනෙකු  මියගිය අතර 43 දෙනෙකු තුවාල ලැබූහ. මේ සම්බන්ධයෙන් පසුව අනාවරණය වූයේ හඳුනාගන්නා ලද ඇතැම් සිරකරුවන් ඝාතනය කිරීමේ මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස මෙය සිදු වූ බවයි. එමෙන්ම මෙම සිදුවීමට අදාළ වින්දිතයන් හා සාක්ෂිකරුවන් විශාල අයුරින් බියගැන්වීම් සිදුකරන ලද අතර චූදිතයන් දේශපාලන හිංසනයට ගොදුරු වූවන් ලෙස පෙන්වාදීමට උත්සාහ කරන ලද පැහැදිලි අවස්ථාවකි.

### 10. රතුපස්වල වෙඩිතැබීම,  2013

විමර්ශන ප්‍රමාද වීමෙන් අනතුරුව, සාමකාමී විරෝධතාවයක දී නිරායුධ සිවිල් වැසියන් හට වෙඩි තැබීමේ චෝදනා සම්බන්ධයෙන් අධිචෝදනා ගොනු කෙරිණි. මෙම නඩුවේ දී ද සාක්ෂිකරුවන් බිය ගැන්වීම සම්බන්ධයෙන් ගෙනහැර දැක්විය හැකි නඩුවකි.

තොරාගන්නා ලද නඩු මඟින් විමර්ශනයන් හි ප්‍රමාදයන් චෝදනා ගොනු කිරීමේ ප්‍රමාදයන් සහ නඩු පැවරීමේ ප්‍රමාදයන් සම්බන්ධව නිදර්ශනයන් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම ගාස්තු සහ ළබැඳියාවන් අතර ගැටුම් පිළිබඳ උදාහරණ තිබිය දී පවා නඩුවේ සැබෑ තත්ත්වය නොතකා බාහිර හේතූන් මත නඩු ඉවත දැමූ අවස්ථා  කිහිපයක් පවතී.[20]

එම නඩු මඟින් වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයේ ද බරපතල අඩුලුහුඬුකම් පෙන්නුම් කරනු ලබයි. මෙම සියලු සිද්ධීන් මගින් පෙන්නුම් කරනුයේ වසර ගණනාවක් හෝ ඇතැම්විට දශක ගණනාවක් තිස්සේ යුක්තිය සම්බන්ධයෙන් වූ වගවීම සඳහා විවිධ බාධක එල්ල වී ඇති බවයි. තවද, එවන් පසුබෑම් තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකා

[20] ඩේලි එෆ් ටී, ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම සඳහා නීතිපතිගේ කාර්යභාරය නැවත සළකා බැලිය යුතු ය, නීතිඥයින් විසින් පවසයි, ලබාගත හැකි වනුයේ <http://www.ft.lk/News/attorney-generals-role-in-defending-sri-lanka-must-be-revisitedlawyers/56-476705>  2020 නොවැම්බර් 25 වන දින ප්‍රවේශ විය. ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම, ශ්‍රී ලංකාව- වගවීම සහතික කිරීමට රජය අපොහොසත් විමේ නිදර්ශනය - ලබාගත හැකි වනුයේ https://www.icj.org/sri-lanka-acquittal-emblematic-of-the-states-failure-to-ensure-accountability/ 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශය විය.

අධිකරණවල පවත්නා සාර්ථකත්වයේ සීමිත අපේක්ෂාවන් පවතින හෙයින් ද වින්දිතයන් බොහෝ පිරිසකට ජීවිත කාලය තුළ යුක්තිය ඉටුවනු දැකීමට නොහැකි වනු ඇත.

## 3. ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ

මෙම පරිච්ඡේදයේ ව්‍යුහාත්මක හා නෛතික ප්‍රතිසංස්කරණ සඳහා තෝරාගත් සිද්ධීන් හි හඳුනාගන්නා ලද ප්‍රමාදයන් හා පසුබෑම් වී තිබේ. මෙහි දී සිදුකර ඇති නිර්දේශයන් වූ කලී මෙකී විෂය කරුණෙහි සමස්ථය සම්බන්ධයෙන් පරිපූර්ණ නිර්දේශ මාලාවක් නොවන නමුත් හුදෙක් ශ්‍රී ලංකාවේ  අපරාධ විනිශ්චය පද්ධතිය තුළ වගවීම සහ යුක්තිය සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ පිළිබිඹු කිරීමක් මෙමඟින් අවධාරණය කර ඇත.

### ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

*පැමිණිලිකරුවන්/ නීතිපති දෙපාර්තමේන්තුව*

පුද්ගලයන්ට එරෙහිව අධිචෝදනාපත්‍ර නිකුත්කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ අභිමතය නීතිපතිවරයා සතුව ඇති අතර සැකකරුවකුට විරුද්ධව මහාධිකරණයේ විභාගවන අපරාධ නඩු විභාගය අත්හැරීමේ බලය ද නීතිපතිවරයා සතු වේ. (*nolle prosequi- පැහැදිලි කිරීම - නොලි ප්‍රොස්ක්වි යනු අපරාධ නඩු කටයුත්තක දී නීතිපතිවරයා විසින් සියලු වැඩිදුර කටයුතු නතර කළ හැකි ය. එය කොන්දේසි විරහිත ඉවත්කර ගැනීමකි. චූදිතයන්ට විරුද්ධව සියලු නඩු කටයුතු එමගින් නිමාවට පත් වේ.* ).[21] නීතිපතිවරයාගේ බලතල සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කිරීමේ දී විවිධ ජාත්‍යන්තර විනිශ්චය ශාලා මෙන්ම අධිකරණය ඉදිරියේ දී රජය ආරක්ෂා කිරීම හා රජය වෙත උපදෙස් ලබාදීමේ බලය නීතිපතිවරයා සතු වේ. එසේ හෙයින්, මෙම ගැටුම්කාරී භූමිකාව විශේෂයෙන් රජයේ පාර්ශවයන් හෝ පුද්ගලයන් සැකසහිත බවට චෝදිත බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් සහ යුධ අපරාධ සම්බන්ධව නඩු පැවරීම්වල දී ළබැඳියාවන් අතර ගැටුම් සඳහා හේතුවනු දැකිය හැකි ය.[22]

එමෙන්ම, ජාත්‍යන්තර අපරාධ නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය යන ක්ෂේත්‍රයන්හි ධාරිතාවය සහ තාක්ෂණික විශේෂඥතාවයේ අවමය සහ මෙම නීතිපති දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වීම සහ ස්වාධීන නොමැති වීම[23] යන කරුණු සැළකීමේ දී ඵලදායී ලෙස චෝදනා ගොනුකිරීම සඳහා නීතිපතිවරයා සතුව ඇති හැකියාව පිළිබඳ සැකයක් ඇතිකරනු ලබයි.[24]

---

[21] 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 12 වන වගන්තිය සහ 135 වන වගන්තිය.

[22] ඩේලි එෆ් ටී, ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම සඳහා නීතිපතිගේ කාර්යයභාරය නැවත සළකා බැලිය යුතු ය, නීතිඥයින් විසින් පවසයි, ලබාගත හැකි වනුයේ <http://www.ft.lk/News/attorney-generals-role-in-defending-sri-lanka-must-be-revisitedlawyers/56-476705> 2020 නොවැම්බර් 25 වන දින ප්‍රවේශ විය. අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලය, අතරු වාර්තාව, (2018 අගෝස්තු), ලබාගත හැකි වනුයේ http://www.jdslanka.org/images/documents/disappearance_executions/the_office_on_missing_persons_interim_report_2018_august.pdf, 30 වන ඡේදය, 2020 නොවැම්බර් 20 වන දින ප්‍රවේශ විය.

[23] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය , ශ්‍රී ලංකාව පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව, ලබගත හැකි වනුයේ, https://www.ohchr.org/EN/HRBodies/HRC/Pages/OISL.aspx 2020 නොවැම්බර් 26 වන දින ප්‍රවේශ විය, එහි 233, 96, 104 සහ 235 පිටු වෙත යොමුවන්න.

[24] ඉසබෙලා ලැසී (ed.), Sri Lanka's Time to Try: Prosecuting Conflict-Related Abuses (1 edn, නීති අධ්‍යයනයන් සඳහා වන දකුණු ආසියානු කේන්ද්‍රය 2019).

තව ද නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන්නා වූ අධික කාර්යභාරය හේතුවෙන් නඩු පැවරීම සම්බන්ධව ප්‍රමාදයන් සිදුවන බව ද නීතිපති දෙපාර්තමේන්තුව විසින්ම පෙන්වා දී ඇත.[25]

මේ සම්බන්ධයෙන් තවදුරටත් සඳහන් කිරීමේ දී 1994 වර්ෂයේ පිහිටුවන ලද බස්නාහිර, දකුණු සහ සබරගමු පළාත් හි අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බැලීමේ කොමිෂන් සභාව සහ 1998 වර්ෂයේ පිහිටුවන ලද ඇතැම් පුද්ගලයන් පැහැරගෙන යාම හා අතුරුදහන් කිරීම සොයාබැලීම පිණිස වූ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවන් මගින් නඩු පැවරීම සම්බන්ධයෙන් වූ ස්වාධීනත්වයේ බරපතල ඌණතාවයන් සම්බන්ධව ඔවුන්ගේ නිරීක්ෂණයන් ඉදිරිපත් කරමින් ''ස්වාධීන නඩු අභිචෝදකවරයකුගේ තනතුරක් ස්ථාපිත කිරීම'' සම්බන්ධව ඔවුන්ගේ නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා මගින් ද යුධ අපරාධ සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයින්ට විරුද්ධව නඩු පැවරීම සඳහා ම වූ විශේෂ උපදේශකවරයෙක් පත්කිරීම සම්බන්ධව පිළිගන්වන ලදි.

මීට අමතරව මෑතක දී සිදුකරන අධ්‍යයන හා වෙනත් ස්වාධීන ආයතන කිහිපයක් විසින් ද නඩු පැවරීම් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කරගෙනයාම සඳහා ස්වාධීන නඩු මෙහෙයවන්නකුගේ විශේෂ කාර්යාලයක් ස්ථාපිත කිරීම සම්බන්ධව සිය නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.[26]

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ද සිය පූර්ව වාර්තාව මගින් විශ්වසනීය හා අපක්ෂපාතී පරීක්ෂණ හා නඩු පැවරීම් සඳහා **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයක්** (IPP Office) පිහිටුවීමට නිර්දේශ කර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව තුළ නඩු පැවරීමේ ක්‍රියාවලීන් ප්‍රතිසංස්කරණය කිරීමට කඩිනම් පියවර ගතයුතු බවත් පෙන්වා දී ඇත.[27] වත්මන් වාර්තාව මගින් පූර්ව වාර්තාවේ නිර්දේශ නැවතත් අවධාරණය කරනු ලබන අතර **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයක්** පිහිටුවීමේ දී සිදුකළ හැකි නෛතික හා ව්‍යුහාත්මක වශයෙන් වූ නිර්දේශ කිහිපයක් පහත දක්වා ඇත.

1. එකී රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලය එහි අධ්‍යක්ෂවරයා සහ කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විතවීම නිර්දේශ කරනු ලබයි. කාර්යාලයේ ප්‍රධාන

---

[25] නීතිපතිවරයා විසින් ආංශික කමිටුව වෙත කරන ලද ඉදිරිපත් කිරීම, නිවුස් ෆස්ට් , ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුව කල්තබා ඇත, ලබාගත හැකිවනුයේ https://www.newsfirst.lk/2020/12/04/lasantha-wickrematunge-homicide-cases-postponed/ 2020 දෙසැම්බර් මස 12 වන දින ප්‍රවේශ විය.

[26] ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් කවුන්සිලය විසින් 2015 ඔක්තෝබර් 1 වන දින සම්මත කරන ලද 30/1 යෝජනාව මගින් නිර්දේශ කරනු ලැබේ, ශ්‍රී ලංකාව පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව (OISL)", උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව, IIGEP හි අවසාන වාර්තාව (ප්‍රවීණ පුද්ගලයින්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම) සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෑතකදී කරන ලද වාර්තාව. 'ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව ගැන නැවත සිතීම: ප්‍රතිසංස්කරණ සඳහා වූ අදහස් . යොමුව https://www.cpalanka.org/rethinking-the-attorney-generalsdepartment-in-sri-lanka-ideas-for-reform/.

[27] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම, ලබාගත හැකිවනුයේ https://www.cpalanka.org/the-needfor-accountability-in-sri-lankas-criminal-justice-system/ 2020 නොවැම්බර් 23 දින ප්‍රවේශ විය.

කාර්යාලය කොළඹ පිහිටුවිය යුතු අතර එහි කාර්යය කර්තව්‍ය (බලාධිකාරය) ඉටුකරගැනීම සඳහා අවශ්‍ය ප්‍රාදේශීය කාර්යාල තිබිය යුතු ය.

2. මෙකී කාර්යාලයේ අධ්‍යක්ෂවරයා පත්කිරීම පාර්ලිමේන්තු අධීක්ෂණය සහිත විනිවිදභාවයකින් යුත් කාර්යය පටිපාටියක් සහිතව ජනාධිපතිවරයා විසින් පත්කිරීම සිදුකළ හැකි ය.[28]
3. සෙසු පොදුරාජ්‍ය මණ්ඩලීය නීති පද්ධතීන් හි එවන් තනතුරක් සඳහා පුද්ගලයකු පත්කිරීමේ දී සළකා බලනු ලබන අවශ්‍යතාවන් කෙරේ අවධානය යොමුකරමින්, අධ්‍යක්ෂවරයා වසර 10 කට නොඅඩු කාලයක් නීති වෘත්තිකයකු ලෙස කටයුතු කර තිබිය යුතු අතර කරුණු සොයාබැලීම හෝ විමර්ශනය, මානව හිමිකම් හා අන්තර් ජාතික මානුෂීය නීතිය පිළිබඳ පූර්ව අත්දැකීම් හෝ කාර්යාලයේ කාර්යයන් ඉටුකරගැනීම සඳහා වන වෙනත් සුදුසුකම් ඔහු සපුරාලිය යුතු බවට නිර්දේශ කරනු ලබයි.
4. එමෙන්ම මෙම කාර්යාලයේ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය වසර 5 කට නොවැඩි විය යුතු නමුත් ඔහු හෝ ඇය පාර්ලිමේන්තුවේ අනුමැතිය සහිතව නැවත පත්කිරීමට සුදුසුකම් ලබයි.
5. කාර්යාලයට බඳවාගැනීම් සිදුකිරීමේ දී එහි සංයුතිය ස්ත්‍රී පුරුෂ භාවය සහ ශ්‍රී ලංකා සමාජයේ බහුත්වාදී ස්වභාවය පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා නිසි සැළකිල්ලක් දැක්වීම මෙන්ම කාර්යාලයේ සාමාජිකයන් අවංකභාවයෙන් යුත් පුද්ගලයන් විය යුතු අතර කාර්යාලයේ කාර්යයන් ඉටුකිරීමට අදාළ පළපුරුද්ද සහ සුදුසුකම් තිබිය යුතු ය..
6. ළබැදියාවන් අතර ගැටුම් ඇති නොවීම සහතික කිරීම පිණිස, නීති වෘත්තිකයන් වන අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ඔහුගේ හෝ ඇයගේ කාර්යාලයේ රාජකාරි වලින් බැහැරව නීති වෘත්තිකයෙකු වශයෙන් ක්‍රියාකිරීම නොකළ යුතු ය.
7. එමෙන්ම කාර්යාලයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී, ගැටුම් ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් වූ වගවීමට එරෙහිව ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කරන ලද, නිල වශයෙන් රජය නියෝජනය කරන ලද හෝ ළබැඳියාවන් අතර ගැටුම් පවතින පුද්ගලයන් බඳවා නොගත යුතු ය.

8. වින්දිත තැනැත්තන්ට කාර්යාලයේ වගකීම දැරීමට අවස්ථාවක් තිබෙන බව සහතික කිරීම සඳහා, කාර්යාලයේ තීරණයන් සමාලෝචනය කිරීමට හැකියාවක් ඇතිකිරීම සඳහා නිර්දේශ කරනු ලබයි.

[28] නීතිය හා සාමය පිළිබඳ දෙපාර්තමේන්තු හා නිලධාරීන් පිළිබඳ පාර්ලිමේන්තුව විසින් කරනු ලබන අධීක්ෂණ ශක්තිමත් කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරන්තර නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඉහත සඳහන් කරන ලද 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම' වාර්තාව පරිශීලනය කරන්න.

*විමර්ශකයන්*

අපරාධ නඩු විධාන සංග්‍රහයේ XI වන පරිච්ඡේදයේ 5 වන කොටසෙහි, අපරාධ විමර්ශන කිරීම සම්බන්ධ නීතිය සහ විමර්ශන නිලධාරීන්ගේ බලතල පිළිබඳ දක්වා ඇත. එම පරිච්ඡේදයේ පොලිස් නිලධාරීන් සහ විමර්ශන නිලධාරීන්ගේ බලතල වලට අදාළ නීතිය දක්වා ඇත. එකී අපරාධ නඩු විධාන සංග්‍රය මඟින් අනුදත් බලතලයන්ට අමතරව පොලිස් ආඥා පනත යටතේ ද අපරාධ විමර්ශන විෂයෙහි පොලිස් නිලධාරීන් සතු බලතල දක්වා ඇත. කෙසේ වුවද, අවස්ථා කිහිපයක දී, පොලීසිය විසින් සපයන ලද සාක්ෂි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සැකකරුවන් නිදොස් කිරීම් සිදුව ඇත.[29] එමෙන්ම, සාක්ෂි විනාශ කිරීම හෝ වෙනස්කිරීම පිළිබඳව ද චෝදනා තිබේ.[30] එමෙන්ම විමර්ශන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහ විමර්ශන සඳහා දේශපාලන මැදිහත්වීම සම්බන්ධයෙන් ද ගැටළු මතුව ඇත.[31] තවද විමර්ශන ක්‍රියාවලියේ ප්‍රමාදයේ ප්‍රතිඵල වශයෙන් බොහෝ සිද්ධීන් හි චෝදනා ගොනුකිරීමේ හා විනිශ්චය ක්‍රියාවලියේ ප්‍රමාදයන් සිදුව ඇත.[32] පොලිස් නිලධාරීන් අධිකරණයට නොපැමිණීම සහ අධිකරණ නියෝග පිළිපැදීමට ඔවුන් අපොහොසත් වීම ද අධිකරණ ක්‍රියාදාමයන් ප්‍රමාදවීමට හේතු වශයෙන් හඳුනාගෙන ඇත.[33]

---

[29] හියුමන් රයිට්ස් වොච්, ශ්‍රී ලංකාව, ත්‍රිකුණාමලය 5 දෙනාගේ පැහැරගැනීම සම්බන්ධයෙන් යුක්තියක් නොමැත, https://www.hrw.org/news/2019/07/08/sri-lanka-no-justice-trinco-5 2020 දෙසැම්බර් 15 වන දින ප්‍රවේශ විය.

[30] වෙරිටේ රිසර්ච් ආයතනය, තාජුඩීන් වෘතාන්තය, ඝාතනය වසන් කිරීම පිළිබඳ නඩු විභාගය ඔක්තෝබර් මාසයේ ආරම්භ වීමට නියමිත ය. ලබාගත හැකි වනුයේ , https://www.veriteresearch.org/2019/07/22/wasim-thajudeen-murder/> 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශ විය.

[31] ඩේලි එෆ් ටී, පොලිස් පරීක්ෂක සිල්වාගේ මාරුව පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන නීතිඥයින්ගේ අවධානය යොමුව ඇත, ලබාගත හැකි වනුයේ http://www.ft.lk/News/Lawyers-for-Democracy-concerned-over-IP-Silva-transfer/56-667202 2020 දෙසැම්බර් 16 වන දින ප්‍රවේශ විය.

[32] නිව්ස් ෆස්ට්, කීති නොයාර් පැහැරගැනීම, හඳුනාගැනීමේ පෙරෙට්ටුව අවලංගු කරන ලදි, ලබාගත හැකි වනුයේ , https://www.newsfirst.lk/2019/08/20/keith-noyahr-assault-identification-parade-cancelled/ 2020 දෙසැම්බර් 17 වන දින ප්‍රවේශ විය, සන්ඩේ ඔබ්සවර්, නීතිපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යුධ ප්‍රකාශ කරයි, ලබාගත හැකි වනුයේ http://www.sundayobserver.lk/2019/09/15/news/ag-declares-war-cid 2020 දෙසැම්බර් 17 වන දින ප්‍රවේශ විය.

[33] ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාවේ අක්‍රීය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය, ලබාගත හැකි වනුයේ http://www.humanrights.asia/resources/books/sri-lankas-dysfunctional-criminal-justice-system/ 2020 දෙසැම්බර් මස 18 වන දින ප්‍රවේශ විය.

සිදුකළ හැකිව තිබෙන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් මෙම වාර්තාව මඟින් විස්තරාත්මකව දක්වා ඇති අතර, **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයක්** තුළ විශේෂ අපරාධ විමර්ශන ඒකකයක් පිහිටුවීමට ඇති හැකියාව ද විමසා බලනු ලබයි.[34] එකී නිර්දේශ කිහිපයක් සංක්ෂිප්තව පහතින් දක්වා ඇත:

1. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සාක්ෂි ආරක්ෂා කරන බව සහතික කිරීම සඳහා, සාක්ෂි නිසිපරිදි සංරක්ෂණය කිරීම, ගබඩා කිරීම සහ තොරතුරු ආරක්ෂා කිරීම සහ විමර්ශන අතරතුර ලබාගන්නා ලද භෞතික සාක්ෂි සම්බන්ධයෙන් විමර්ශන නිලධාරීන් වගකිව යුතු ය. තවද විමර්ශන නිලධාරීන් විසින් විමර්ශනයට අදාළ සියලුම සාක්ෂි අන්තර්ගත කරමින් සවිස්තරාත්මක ඉන්වෙන්ටරියක් සකස් කිරීම ද සිදුකළ යුතු ය.[35]
2. එක් එක් සිද්ධිය යටතේ වූ සාක්ෂි ඒකරාශී කරන ලද දත්ත සමූහය වෙත පාර්ලිමේන්තු අධීක්ෂණ මණ්ඩලයක් හෝ අදාළ අධිකරණ නිලධරයන් වැනි පිරිසකට ප්‍රවේශය ලබාදීම තුළින් සාක්ෂි රැස්කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා නිර්දේශ කරනු ලබයි.[36]
3. පොලිස් සේවයේ ධුරාවලිය තුළ පොලිස් නිලධාරියකු ජාත්‍යන්තර වශයෙන් අපරාධයක් වශයෙන් පිළිගත් වරදක් සිදුකළ කල්හි ඒ සඳහා වගකීමට ලක්කෙරෙන්නා වූ මූලධර්මය ස්ථාපිත කළ යුතු ය.[37] පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයකුට සිදුකරනු ලබන්නා වූ වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ පහත් සැළකීම් හෝ දඬුවම් (CIDTP) සඳහා උසස් පොලිස් නිලධාරීන් වගකිව යුතු බව මෙයින් සහතික කෙරේ.
4. විමර්ශන නිලධාරීන්ට ප්‍රමාණවත් අධිකරණ වෛද්‍ය පහසුකම් හා පුහුණුව මෙන්ම විමර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය සම්පත් ද ලබාදිය යුතු ය. රථවාහන, පුහුණුව ලත් පිරිස් සහ උපකරණ ඇතුළුව අවශ්‍ය මානව හා භෞතින සම්පත් ලබාගැනීම සහතික කළ යුතු ය.
5. අමතරව, විමර්ශන නිලධාරීන්ට ඇති ආරක්ෂාව ශක්තිමත් කළ යුතු අතර එනම් විමර්ශකයින්ගේ ශාරීරික වශයෙන් වූ අවධානම මෙන්ම ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආයතනික ආරක්ෂණය සහතික කිරීම සහ ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදය හා ධුරයෙන් ඉවත්කිරීම විනිවිදභාවයෙන් යුක්තව සිදුකළ යුතු ය.
6. පොලිස් බලකායේ සංයුතිය තුළ ජාතිය, ආගම සහ ස්ත්‍රී පුරුෂභාවය ඇතුළත්ව ශ්‍රී ලංකා සමාජයේ විවිධත්වය නියෝජනය වන බවට සහතික විය යුතු ය.

[34] පොලිස් නිලධාරීන්ගේ ස්වාධීනත්වය පිළිබඳව වන බරපතල ප්‍රශ්න කෙරේ මූලික අවධානය යොමු කළ යුතු ය. ඒ අර්ථයෙන් ඉවත්ව යන ප්‍රතිසංස්කරණයන් කෙරේ මහජන අවධානය, සහයෝගය හෝ විශ්වසනීයත්වය ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. පොලිස් පද්ධතියට පරිබාහිරව වූ නියෝජිත ආයනයක් හරහා එවැනි තත්ත්වයක් සාර්ථකව ආමන්ත්‍රණය කරන ලද හොංකොංහි උදාහරණය කෙරේ අවධානය යොමු කළ යුතු ය, දූෂණයට එරෙහිව වූ ස්වාධීන කොමිසම පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කළ යුතු ය. උපුටා ගැනීම,'ශ්‍රී ලංකාවේ අක්‍රිය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය '

[35] අපරාධ විනිශ්චය සභාවන් සඳහා එක්සත් ජාතීන්ගේ අවශේෂ යාන්ත්‍රණය, රුවන්ඩාව සඳහා ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව, ක්‍රියාපටිපාටි සහ සාක්ෂි, ලබාගත හැකි වනුයේ , https://unictr.irmct.org/en/documents/rules-procedureand-evidence 2020 දෙසැම්බර් 21 වන දින ප්‍රවේශ විය.

[36] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම , ලබාගත හැකිවනුයේ https://www.cpalanka.org/the-needfor-accountability-in-sri-lankas-criminal-justice-system/ 2020 නොවැම්බර් 23 වන දින ප්‍රවේශ විය.

[37] ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාවේ අක්‍රීය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය, ලබාගත හැකි වනුයේ http://www.humanrights.asia/resources/books/sri-lankas-dysfunctional-criminal-justice-system/ 2020 දෙසැම්බර් මස 21 වන දින ප්‍රවේශ විය.

7. අධිකරණය මගින් යම් දිනයක් ලබාදී ඇත්නම් ඒ දිනයේ දී ඒ සඳහා නම්කර ඇති පොලිස් නිලධාරීන් උසාවියට පැමිණීම අනිවාර්ය්‍ය කිරීම සඳහා පරිපාලනය ක්‍රියාමාර්ග හඳුන්වා දීම සිදුකළ යුතු ය.

ඉතා මෑත දී තීන්දුවක් ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලද්දේ ''නීතිය ක්‍රියාත්මක කරනු ලබන බලධාරීන් විසින් බලය අයුතු ලෙස පරිහරණය කිරීමේ සිද්ධීන් වර්ධනයක් දක්නට ලැබෙන බවයි'' ඒ අනුව, නීතිය ක්‍රියාත්මක කරනු ලබන බලධාරීන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සකස් කරන ලෙස අධිකරණය විසින් පොලිස්පතිවරයාට නියම කරන ලදි.[38]

එමෙන්ම, දේශපාලන මැදිහත්වීම්, අකාර්යක්ෂමතාවය සහ විනය ගැටළු වැනි කරුණු හේතුවෙන් ශ්‍රී ලංකාවේ පවතින ක්‍රමය වැනි ක්‍රමයක් කිසි අයුරකින් ප්‍රතිසංස්කරණය කළ හැකි ද යන්න බොහෝදෙනා ප්‍රශ්න කිරීමට ලක්කිරීමට හේතු වී තිබේ.[39] මෙහි දී අවධාරණය කරනුයේ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන තුළ මෙතරම් ගැඹුරට මුල්බැස ඇති අක්‍රමිකතාවන්ට හේතුව ඇති දේශපාලන හා සමාජීය කරුණු කෙරේ අවධානය යොමුකළ යුතු බවයි. එවැනි සංශයන් සැළකිල්ලට ගනිමින්, පොලිසිය සහ නඩුපැවරීම සිදුකරන්නන් විසින් විමර්ශනාත්මක බලතල බෙදාගතහැකි ව්‍යුහයන් පරීක්ෂා කිරීම ද ප්‍රයෝජනවත් වනු ඇත. මේ අතුරින් දියුණු කළහැකි ව්‍යුහයක් වනුයේ පහත සඳහන් කර ඇති යෝජිත බලතල සහිත වූ **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයක්** (IPP Office) තුළ අපරාධ විමර්ශන ඒකකයක් පිහිටුවාලීමයි.

1. මෙම ඒකකය පොලිස් බලකායෙන් ලබාගන්නා ලද විශේෂ පුහුණුව ලත් විමර්ශන නිලධාරීන් මෙන්ම **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයේ** (IPP Office) සාමාජිකයන් වන නීති වෘතිකයන්ගෙන් (නඩු පවරන නිලධාරීන්ගෙන්) සමන්විත විය යුතු ය.[40]
2. සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම, සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම, ගවේශණය, තහනම් කිරීම, පරීක්ෂා කිරීම, රඳවා තබාගැනීම සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම යන බලතල ඇතුළත්ව අපරාධ නඩුවලදී පොලීසිය සමඟ වූ සමගාමී විමර්ශන බලතල මෙම ඒකකයට අනුයුක්ත විමර්ශන නිලධාරීන්ට ඇත.

---

[38] මානව හිමිකම් සඳහා ගරුකිරීම, නීත්‍යනුකූලභාවය, අවශ්‍යතාවය, වෙනස් කොට නොසැළකීම, සමානුපාතිකත්වය,නීතියේ සමාන රැකවරණය සහ කාන්තාවන් සහ ළමුන් රඳවා තබාගැනීමේ දී විශේෂ සැළකිල්ලක් දැක්වීම සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් මෙම මාර්ගෝපදේශය මගින් දක්වනු ලබයි. ලන්දගේ ඉෂාරා අන්ජලී (බාලවයස්කරු) සහ තවතත අය එදිරිව ස්ථානාධිපති , මාතර පොලිස් ස්ථානය සහ තවත් අය " SC (FR) Application No. 677/2012.

[39] ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාවේ අක්‍රීය අපරාධ යුක්ති විනිශ්වය පද්ධතිය, යොමුව http://www.humanrights.asia/resources/books/sri-lankas-dysfunctional-criminal-justice-system/ 2020 දෙසැම්බර් මස 21 වන දින ප්‍රවේශ විය.

[40] "නඩු පවරන්නු ලබන්නන් විමර්ශනය ආරම්භ කරන රටවල, නඩු පවරනු ලබන්නාගේ එලදායී කාර්යභාරය හේතුවෙන්, හොඳ විමර්ශනයකට තුඩු දෙන යම් යම් ප්‍රතිලාභ ඇති බව අවබෝධ විය.
නඩු පවරන්නන්ට ප්‍රමාණවත් නෛතික දැනුමක් ඇති අතර නෛතික අර්ථ නිරූපණයන්හි සංවාදයේ යෙදෙන බැවින් ඔවුන් අධිචෝදනා පත්‍ර සඳහා හොඳ නඩු සූදානම් කරති. ඔවුන්ගේ හැකියාව සහ පළපුරුද්ද අපරාධ මැඩලීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ පද්ධතියට ප්‍රතිලාභයක් ලෙස සැලකේ. මීට පෙර නඩු විභාගය සඳහා පැමිණිලිකරුවන්ගේ මැදිහත්වීම සාර්ථක නඩු පැවරීමක් සහ වරදකරුවෙකු බව සහතික කරයි. " එක්සත් ජාතීන්ගේ ආසියාව සහ අපරාධ වැළැක්වීම සහ වැරදිකරුවන්ට සැලකීම සඳහා වන පෙරදිග ආයතනය (UNAFEI), 'පොලීසිය හා විමර්ශන වගකීම සමඟ පැමිණිල්ලේ සම්බන්ධතාවය,https://www.unafei.or.jp/publications/pdf/RS_No53/No53_29RC_Group1.pdf වෙතින් 2020 දෙසැම්බර් 22 වන දින ප්‍රවේශ විය.

3. සාක්ෂි අවභාවිත කිරීම සඳහා වන දේශපාලන බලපෑම් වළක්වා ගැනීම සඳහා ඒකකයේ විමර්ශන හෝ නඩු පැවරීම් හා සම්බන්ධ වන නිලධාරීන් විසින් විභාගවෙමින් පවතින නඩුවල සාක්ෂිවල රහස්‍යභාවය සහතික කළ යුතු වේ.
4. ඒකකයේ නිලධාරීන් හට එවන් දේශපාලන බලපෑම් කිරීමට දරන්නා වූ ඕනෑම උත්සාහයක් **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයේ** අධිකාරියට එරෙහිව කරන අපහාස වරද උද්ගත කරනු ඇත.
5. අදාළ සාක්ෂි පිළිබඳ ඉන්වෙන්ටරියන් එකී නඩු කටයුත්තේ විමර්ශනය භාර පොලිස් නිලධාරියා විසින් සම්පාදනය කර එය විමර්ශන ඒකකය වෙත භාරදෙනු ලබයි.
6. විභාග වෙමින් පවතින විමර්ශනයන්වල ස්ථාවරය සාකච්ඡා කිරීම සඳහා පොලීසිය හා නඩු පවරනු ලබන නිලධාරීන් විසින් නිතපතා රැස්වීම් පැවැත්වීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර මෙහි දී නිවැරදි හා කාලෝචිත ආකාරයකින් විමර්ශන අවසන් කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ල වෙනුවෙන් ක්‍රියාකරන නිලධාරීන් හට උපදෙස් ලබාදිය හැකි ය..[41]

## ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ

වගවීම පිළිබඳ ගැටළු විසඳීම, ජාත්‍යන්තර අපරාධ මෙරට තුළ නිතිගත කිරීම සහ කාර්ය පටිපාටික නීති සමාලෝචනය කිරීම හා ප්‍රතිසංස්කණය කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය පෙර වාර්තාව මගින් නිර්දේශ කර ඇත.[42] වගවීම සඳහා බාධාකාරී වන නීති සම්පාදනයේ සීමාවන් පිරික්සීම සහ ප්‍රතිසංස්කරණ සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීම, සංසන්දනාත්මක අධිකරණ බලය තුළින් අත්දැකීම් ලබාගැනීම සම්බන්ධව වත්මන් වාර්තාවෙන් අවධානය යොමු කර ඇත.

ශ්‍රී ලංකාව ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය එහි විනිවිදභාවය හා සහභාගීත්වය නොමැතිකම හේතුවෙන් විවේචනයට ලක්විය.[43] කෙටුම්පත් කරන ලද නීති සඳහා කැබිනට් ලැබුණු පසු එය ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලබයි[44] පනත් කෙටුම්පත ගැසට් කළ දින සිට සතියක් ගතවීමෙන් පසු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි ය. එයින් සතියක් ඇතුළත පුරවැසියකු හට එකී පනත් කෙටුම්පත අභියෝගයට ලක් කළ හැකි ය.[45] නීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය සමඟ පුරවැසියන් සම්බන්ධ කර ගැනීමට ඇති අවකාශය සහ සියලු

[41] අපරාධ වැළැක්වීම සහ වැරදිකරුවන්ට සැළකීම වැළැක්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආසියානු සහ අග්නිදිග ආසියානු ආයතනය, පොලීසිය විමර්ශන වගකීම සමග වූ පැමිණිල්ලේ සම්බන්ධතාවය, ලබාගත හැකි වනුයේ https://www.unafei.or.jp/publications/pdf/RS_No53/No53_29RC_Group1.pdf 2020 දෙසැම්බර් 22 වන දින ප්‍රවේශ විය
[42] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම, යොමුව https://www.cpalanka.org/the-needfor-accountability-in-sri-lankas-criminal-justice-system/ 2020 නොවැම්බර් 23 දින ප්‍රවේශ විය.
[43] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, දකුණු ආසියාව - ශ්‍රී ලංකාව, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සමීක්ෂණයක්, ලබාගත හැකිවනුයේ, http://www.cpalanka.org/wp-content/uploads/2007/8/Sri_Lanka.doc> 2021 ජනවාරි 20 වන දින ප්‍රවේශ විය.
[44] ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන වගන්තිය (සංශෝධිත)
[45] ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන වගන්තිය (සංශෝධිත)

පාර්ශවයන් සම්බන්ධ කර ගනිමින් විවාද හා සාකච්ඡා ඇති කිරීම සඳහා වූ අවස්ථාව මෙකී සීමිත කාල සීමාව මගින් අඩු කරනු ලබයි.[46]

තවදුරටත් සළකා බැලිය යුතු අදාළ නීති පහත දැක්වේ:

*1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය*

අපරාධ නඩු විධාන සංග්‍රහය මඟින් අපරාධ නඩු කටයුතු වලදී නඩු පැවරීම සඳහා ඇති පුළුල් බලතල නීතිපති වෙත ලබාදෙනු ලබයි.[47] මෙම වාර්තාව තුළ කලින් නිර්දේශ කරනු ලැබ ඇති පරිදි රජයේ ස්වාධීන නඩු මෙහෙයවන්නකුගේ කාර්යාලයක් පිහිටුවීම සඳහා, නීතිපතිවරයා හට ඇති නඩු පැවරීමේ බලතල ඉවත්කිරීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළ යුතුව ඇත.

අපරාධ සඳහා ලබාදෙනු ලබන මුක්තියට එරෙහිව ක්‍රියාකිරීම සඳහා වූ මූලධර්ම මාලාව යාවත්කාලීන කිරීම සඳහා වූ ස්වාධින විශේෂඥයකුගේ වාර්තාවකට අනුව බොහෝ රටවල යුක්තිය සඳහා ඇති අයිතිය ආරක්ෂා කර තිබෙනුයේ වින්දිතයන් හට සිවිල් සමාජය හට අපරාධ නඩු පැවරීමට හා සහභාගීවීමට ඉඩ සළසන්නා වූ නීති මඟිනි.[48] ප්‍රමාණවත් නඩු පැවරීම් නොමැතිවීම, නඩු පැවරීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම මෙන්ම නඩු පවරනු ලබන අධිකාරියේ ස්වාධීනත්වය පිළිබඳව පවතින උත්සුකයන් ශ්‍රී ලංකාව සඳහා ධනාත්මක ප්‍රතිසංස්කරණයන් සඳහා වූ පියවරයන් යොජනා කර ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තිය යටතේ නීතිපතිවරයාගේ පූර්ව අවසරයකින් තොරව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෞද්ගලිකව නඩු පැවරීම සඳහා වින්දිතයන් සවිබල ගන්වනු ලබයි. කෙසේ වුව ද, එවැනි නඩු පැවරීම් ආරම්භ කළ හැකි වනුයේ මහේස්ත්‍රාත් අධිකරණයේ බලසීමාව තුළ පවතින වැරදි සම්බන්ධව පමණක් වන අතර ඇතැම් අවස්ථාවල දී එනම් යම් රජයේ නිලධාරියෙකුගේ හෝ එකී නිලධාරියාගේ නිල රාජකාරි ඉටුකිරීමේ දී හෝ ඊට අදාළ කාරණයක් සම්බන්ධයෙන් රජයේ සේවකයෙකු වෙත හෝ නිලධාරියෙකුට එරෙහිව එවැනි පැමිණිල්ලක් ගොනු කර ඇති අවස්ථාවන්හි දී නීතිපතිවරයා හට එකී පැමිණිල්ල භාරගත හැකි ය.[49]

[46] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය , යෝජිත 20 වැනි සංශෝධනය යටතේ සිදු වූ වෙනස්කම්වල සාරාංශය , ලබාගත හැකි වනුයේ, https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Final-doc-Summary-of-Changes-Under-the-Proposed-20th-Amendment.pdf> 2021 ජනවාරි 16 වන දින ප්‍රවේශ විය.

[47] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳ නැවත සිතා බැලීම - ප්‍රතිසංස්කරණ සඳහා අදහස්, ලබාගත හැකි වනුයේ , https://www.cpalanka.org/rethinking-the-attorney-generals-department-in-sri-lanka-ideas-for-reform/ 2020 නොවැම්බර් 23 වන දින ප්‍රවේශ විය.

[48] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම, දඬුවම් සඳහා වන මුක්තියට එරෙහිව වූ මූලධර්ම මාලාව යාවත්කාලීන් කිරීම සඳහා වූ ස්වාධීන විශේෂඥ වාර්තාව, ලබාගත හැකි වනුයේ <https://www.refworld.org/docid/42d66e780.html> 2020 දෙසැම්බර් මස 20 වන දින ප්‍රවේශ විය. 44 වන ඡේදය පරිශීලනය කරන්න.

[49] 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 191(2) වගන්තිය.

### *1887 අංක 11 දරන දණ්ඩ නීති සංග්‍රහය*

ශ්‍රී ලංකාවේ දණ්ඩනීති සංග්‍රහය තුළ හරයාත්මක අපරාධ නීතිය අන්තර්ගත වේ. නමුත් දණ්ඩ නීති සංග්‍රහයේ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝණය කිරීම් හේතුවෙන් පැන නඟින ජාත්‍යන්තර අපරාධ සම්බන්ධ නීතිය අන්තර්ගත නොවේ. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ පවතින දේශීය අපරාධ නීතිය මඟින් වර්ගඝාතනය, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් සන්දර්භය තුළ සිදුකරන ලද යුධ අපරාධ ද අපරාධ වශයෙන් හඳුනාගෙන නොමැත.[50]

එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවත්නා සාපරාධී වැරදි, යුධ අපරාධ සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් නඩු පැවරීමට යොදාගත යුතු ය. වරදෙහි බරපතලකම හා ඊට අදාල ක්‍රමානුකූල කරුණු සැළකිල්ලට ගැනීමට අපොහොසත්වීම එහි ප්‍රතිඵලයක් විය හැකි ය. සන්නද්ධ ගැටුම් සන්දර්භයන් තුළ සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන් එනම් ලිංගික අපරාධ (විශේෂයෙන්ම හරකාරත්වයේ දී සිදුවන ලිංගික අතවර), මිනිස් පළිහ භාවිත කීම, මානුෂීය සහන ප්‍රතික්ෂේප කිරීම, බලහත්කාරයෙන් සිදුකරන්නා වූ අතුරුදහන් කිරීම්, රාජ්‍ය මැදිහත්වීම් තුළින් සිදුකරනු ලබන මිනීමැරුම් සහ වෙනත් උල්ලංඝණයන් සම්බන්ධයෙන් දණ්ඩනීති සංග්‍රහය සංශෝධනය කළ යුතුව ඇත.

ජාත්‍යන්තර අපරාධයන්හි මූලාංගයන් ප්‍රමාණයත් පරිදි ආවරණය කිරීමට දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රමාණවත් නොවිය හැකි ය.[51] මීට අමතරව, විධාන වගකීම වැනි ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ ඇති වගකීමට ලක්කිරීමේ ක්‍රම දේශීය අපරාධ නීතියේ දක්නට නොමැත.ඒ අනුව වරදට වඩාත්ම වගකිව යුතු පුද්ගලයන් වෙත නඩු පැවරීමෙන් බේරීයාමට ඉන් ඉඩ සළසනු ඇත.

උදාහරණයක් වශයෙන්, පූර්ව යුගෝස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව විසින් සාක්ෂි පිළිබඳ දක්වන ලද මතයන් සහ කාර්යය පටිපාටිය හරහා සමාලෝචනයක් සඳහා අධිචෝදනා පත්‍රයක් ලැබුණු විට බියුරෝව විසින්[52] එකී අධිචෝදනාව තුළ බැලූ බැල්මට පෙනෙන නඩුවක් තිබේද යන්න වග, එමෙන්ම විනිශ්චය සභාවේ බල සීමාව තුළ සිදුවන අපරාධවලට වඩාත්ම වගකිව යුතු යැයි සැකකරන ජ්‍යෙෂ්ඨ නායකයින් එකක් හෝ වැඩි ගණනක් කෙරේ අවධානය යොමු කරනු ලබයි. අධිචෝදනා පත්‍රය මෙම ප්‍රමිතියට අනුකූල නොවන බවට බියුරෝව විසින් තිරණය කරනු ලබන්නේ නම්, අධිචෝදනා පත්‍රය ආපසු ලබාදෙනු ලැබේ.[53]

[50] Isabelle Lassée and Eleanor Vermunt, 'Fitting the Bill': ශ්‍රී ලංකාවේ නීතිය තුළට අන්තර්වාතික වශයෙන් සිදුවන අපරාධයන් අන්තර්ගත කිරීම'. in Isabelle Lassée (ed), Sri Lanka's Time to Try: Prosecuting Conflict-Related Abuses (නීති අධ්‍යයනයන් සම්බන්ධයෙන් වන දකුණු ආසියානු කේන්ද්‍රය 2019).

[51] ඉහත එම, 'පනත හා ගැළපීම'

[52] එකී බියුරෝව සමන්විත වනුයේ සභාපති, උපසභාපති සහ නඩු විභාගයේ මුලසුන හෙබවූ විනිසුරුවන්ගෙනි.

[53] අපරාධ විනිශ්චය සභාවන් සඳහා එක්සත් ජාතීන්ගේ අවශේෂ යාන්ත්‍රණය, රුවන්ඩාව සඳහා ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව, ක්‍රියාපටිපාටි සහ සාක්ෂි, ලබාගත හැකි වනුයේ , https://www.icty.org/x/file/Legal%20Library/Rules_procedure_evidence/IT032Rev50_en.pdf වෙතින් 2020 දෙසැම්බර් 21 වන දින ප්‍රවේශ විය, එහි 28 වන රීතිය පරිශීලනය කරන්න.

### *2015 අංක 04 දරන අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත*

වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සැපයීම සඳහා බලපානු ලබන විධිවිධාන ඕනෑම අධිකරණ පද්ධතියක විශ්වසනීයත්වය සහ දඬුවම් ලබානොදීමට විරුද්ධවීම කෙරේ වූ සටනට අත්‍යවශ්‍ය වේ.[54] අපරාධයට ලක් වූ වින්දිතයන් හා ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත්කරනු ලබන සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ තාක්ෂණික විශේෂඥතාවය සහ ධාරිතාවය වර්ධනය කිරීම මෙන්ම අදිකාරියේ ස්වාධීනත්වය ඇතුළත්ව පනත යටතේ ස්ථාපිත කර තිබෙන පරිදි වින්දියන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂණ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පූර්ව අවස්ථාවන්හි දී ද නිර්දේශ ඉදිරිපත් කර ඇත.[55] නිදසුනක් වශයෙන් වශයෙන් රාජ්‍ය ආයතනයන්හි සිදුවන දූෂණ සහ දේශපාලනීකරණය මඟින් සංයුක්ත වන ආරක්ෂණ යාන්ත්‍රණයන් සම්බන්ධයෙන් වන රාජ්‍ය පාර්ශවයන්ගේ මැදිහත්වීම් වලට ජාතික අධිකාරිය ගොදුරු විය හැකි ය. එබැවින් ප්‍රතිසංස්කරණයන්හි අරමුණ විය යුත්තේ අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ සංයුතිය තුළ ස්වාධීන සාමාජිකයන් ඇතුළත් කර ඇති බව සහතික කිරීම මගින් අධිකාරියේ කාර්යයන් සහ විනිවිදභාවය ශක්තිමත් කිරීමයි.

මෙහිදී සැළකිලිමත් විය යුතු වන්නේ, ආරක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ සඳහා සියලු පාර්ශවන්ගේ දායකත්වයන් ලැබිය යුතු අතර වඩාත්ම වැදගත් වන්නේ අධිකාරියේ ආරක්ෂාව පතන පුද්ගලයන් ඇතුළත්ව සියලු පුද්ගලයන් නැවත වින්දිතයන් වීම වැළැක්වීම සහ පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම යි.[56]

### *1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත*

1979 වර්ෂයේ දී තාවකාලික විධිවිධානයක් ලෙස බලාත්මක කරන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වර්තමානය දක්වා ඵලදායී පනතක් වශයෙන් ස්ථිරව පවතී. එමෙන්ම මෙකී පනත මගින් සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීමයනාදී පුළුල් බලතල සපයන අතර සද්භාවී චේතනාවෙන් යුක්තව කටයුතු කරනු ලබයි නම්, වගකිවයුතු නිලධාරීන් හට ඔවුන්ට හිමි මුක්තිය සහතික කරනු ලබයි.[57] කෙසේ වුවද සද්භාවී චේතනාව පිළිබඳව අර්ථ දැක්වීමක් නොමැති අතර ඉන් සද්භාවී චේතනාවෙන් සිදුකරනු ලබන පුළුල් පරාසයක ක්‍රියාවන් අර්ථ නිරූපණය කළ හැකි ය.[58]

---

[54] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත - විවේචන සහ නිර්දේශයන් , ලබාගත හැකිවනුයේ https://www.cpalanka.org/the-draft-bill-for-the-assistance-and-protection-of-victims-of-crime-and-witnesses-critique-and-recommendations/ 2020 දෙසැම්බර් 20 දින ප්‍රවේශ විය.

[55] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය , වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය, ලබාගත හැකි වනුයේ https://www.cpalanka.org/the-need-for-a-strong-victim-and-witness-assistance-andprotection-mechanism/ 2020 දෙසැම්බර් මස 21 වන දින ප්‍රවේශ විය.

[56] සත්‍ය සහ යුක්තිය පිළිබඳ අන්තර්ජාතික වාර්තාව, 'සාක්ෂිකරුවන් සුරැකීම: බැටළුවන්ගේ ආරක්ෂාවට වෘකයන් යෙදවීම', යොමුව https://itjpsl.com/reports/witness-protection 2020 දෙසැම්බර් මස 21 වන දින ප්‍රවේශ විය.

[57] 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික ප්‍රතිපාදන) පනතේ 26 වන වගන්තිය.

[58] ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගවීම සඳහා පවතින අභියෝග ( Challenges to Accountability for Human Rights Violations in Sri Lanka: A Discussion Paper' ) සාකච්ඡා පත්‍රිකාව, ලබාගත හැකි වනුයේ https://www.icj.org/wp-content/uploads/2017/03/Sri-Lanka-FCO-Accountability-1-Advocacy-Analysis-brief-2017-ENG.pdf 2020 දෙසැම්බර් මස 21 දින ප්‍රවේශ විය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට පත් වූ පුද්ගලයකු වසර එකහමාරක් දක්වා රඳවා තබාගැනීමට අමාත්‍යවරයාට නියම කළ හැකි අතර සාක්ෂි ආඥා පනතේ ඇතැම් අවශ්‍යතාවන්ට පටහැනිව අත්අඩංගුවේ සිටින පුද්ගලයකු සිදුකරන ලද ප්‍රකාශයක් හෝ පාපොච්චාරණයක් එකී තැනැත්තාට විරුද්ධව ඔප්පු කළ හැකි අතර තර්ජනය හේතුවෙන් කරන ලද පාපොච්චාරණයක් බව ඔප්පු කිරීමේ භාරය චූදිතයා වෙත පැවරේ.[59] මෙහි ප්‍රතිඵලය වී තිබෙනුයේ රැඳවියන් හට වධහිංසා පැමිණවීම සහ කෲර සහ වෙනත් ආකාරයේ අමානුෂික සැළකීම මඟින් නීතිය ක්‍රියාත්මක කරනු ලබන බලධාරීන් විසින් ඔවුන්ගෙන් පාපොච්චාරණයන් ලබාගැනීමට උත්සාහ කිරීමට දිරිමත් කිරීම වේ.[60]

පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු මෑතක දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම් හි වැඩිවීමක් දක්නට ලැබේ. මෙය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අදාළව ශ්‍රී ලංකාවේ අතීත අත්දැකීම්වලට එරෙහිව වූ කරදරකාරී අහිතකර වර්ධනයකි.

එමෙන්ම රජයේ විරුද්ධවාදීන් හා විවේචකයින් ඉලක්ක කර බිය ගැන්වීම් සිදුකිරීම් සඳහා අනුප්‍රාප්තික රජයන් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පොලිස් අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම හා මරණයට පත්වීම පිළිබඳ ගණනය කළ නොහැකි තරමේ සිදුවීම් දක්නට ලැබෙන අතර, ඒ සඳහා මෙරට අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ සහන සහ වගවීම අතිශයින් දුර්ලභ ය.

ශ්‍රී ලංකාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව (OISL), ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම් නිර්දේශ කරනු ලබයි.[61]ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින රැඳවියන්ගේ සියලු නඩු සමාලෝචනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ ආරක්ෂක ආයතන විසින් සිදුකරන ලද වධහිංසා චෝදනා පිළිබඳ සියලු විමර්ශන සහ නඩු පැවරීම් තවදුරටත් නිර්දේශ කරයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් සමකාලීන මානව හිමිකම් ප්‍රමිතීන් උල්ලංඝණය කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිරන්තරයෙන් සිය අවධානය යොමු කර ඇති අතර එය අවලංගු කරන ලෙසට ඉල්ලා සිටින ලදි.[62]

---

[59] 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 26 වන වගන්තිය.

[60] ඇමෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය, ‘Sri Lanka: Countering Terrorism At the Expense of Human Right ලබාගත හැකි වනුයේ https://www.amnesty.org/download/Documents/ASA3797702019ENGLISH.PDF 2020 දෙසැම්බර් මස 20 වන දින ප්‍රවේශ විය. හියුමන් රයිට්ස් වොච්, Locked Up Without Evidence: Abuses under Sri Lanka’s Prevention of Terrorism Act’, සාක්ෂි නොමැතිව අගුළු දැමීම, (ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන අපයෝජනයන්) ලබාගත හැකි වනුයේ, https://www.hrw.org/report/2018/01/29/locked-without-evidence/abuses-under-sri-lankas-prevention-terrorism-act 2020 දෙසැම්බර් මස 20 වන දින ප්‍රවේශ විය.

[61] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාව පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව (OISL), https://www.ohchr.org/EN/HRBodies/HRC/Pages/OISL.aspx වෙතින් ලබාගත හැකි ය, 249 පිටුව වෙත යොමුවන්න

[62] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කර ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය, ලබාගත හැකි වනුයේ https://www.cpalanka.org/the-need-to-repeal-and-replace-the-prevention-of-terrorism-act-pta/ 2020 දෙසැම්බර් 22 වන දින ප්‍රවේශ විය. විකල්ප ප්‍රතිපත්ති කේනද්‍රය ,නව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නව රෙගුලාසි සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය, ලබාගත හැකි වනුයේ , https://www.cpalanka.org/cpa-statement-on-the-new-regulations-under-the-prevention-of-terrorism-act/ 2020 දෙසැම්බර් 21 සිට ප්‍රවේශ විය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ,යෝජිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අභියෝගයට ලක්කිරීම සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත්වීම, ලබාගත හැකි වනුයේ https://www.cpalanka.org/cpa-intervenes-on-the-challenge-to-the-proposed-counter-terrorism-bill/ 2020 දෙසැම්බර් 22 වන දින ප්‍රවේශ විය.

## 4. නිගමනය

වත්මන් රජය විසින් ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානය වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකවේ කැපවීම ප්‍රතික්ෂේප කිරීම මෙන්ම සීමිත ප්‍රගතිය පවා ආපසු හැරවීමට අදහස් කරන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග හේතුවෙන් මානව හිමිකම් උල්ලංඝණයන්ට ගොදුරු වූවන් හට යුක්තිය ඉටු කරගැනීමේ හැකියාව පිළිබඳව බරපතල කණස්සල්ලක් මතුකරනු ලබයි.[63]

මෙම සන්දර්භය තුළ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පළකරනු ලබන මෙකී වාර්තාවේ දී මෙන්ම පූර්ව වාර්තාවන්හි ද නිර්දේශිත ව්‍යුහාත්මක හා නෛතික ප්‍රතිසංස්කරණ සඳහා වූ කඩිනම් අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. මෙම වාර්තාවේ ඉස්මතු කර තිබෙනුයේ මන්දගාමී ප්‍රගතියක් දක්වා ඇති සහ දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලැබූ ගණනය කළ නොහැකි සිද්ධීන් අතුරින් අතළොස්සක් පමණි. මෙම උල්ලංඝණයන්ට ගොදුරු වූවන්ට ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය හරහා යුක්තිය ඉටුවීම සම්බන්ධයෙන් වූ විශ්වාසය නැතිව යන අතර විස්තීර්ණ හා අව්‍යාජ ප්‍රතිසංස්කරණ තුළින් ඔවුන්ගේ ගැටළු විසඳීම අත්‍යවශ්‍ය වේ.

[63] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සුනිල් රත්නායක වෙත සමාව දීමට ගත් තීරණය අභියෝගයට ලක් කරන මූලික අයිතිවාසිකම් අයදුම්පතක්, යොමුව, ලබාගත හැකි වනුයේ https://www.cpalanka.org/fundamental-rights-applicationschallenging-the-decision-to-pardon-sunil-ratnayake/ 2020 නොවැම්බර් 23 වන දින ප්‍රවේශ විය.
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති C FR 32/2020 https://www.cpalanka.org/centre-for-policy-alternatives-v-attorney-general-sc-fr-32-2020/

## ඇමුණුම 1 - නිදර්ශනාත්මක නඩු දහයෙහි කාලරාමුව හා විස්තර

පහත සඳහන් කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත ලැබෙන තොරතුරු හා මාධ්‍ය වාර්තා මත පදනම් වීමෙනි. 2019 වර්ෂයේ මාර්තු මාසයට පෙර මෙකී නඩුවල ප්‍රගතිය සහ පසුබිම විමර්ශනය සඳහා, මෙම විෂය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි පෙර වාර්තාව වෙත යොමුවන්න.[64]

| 1. ජෝෂප් පරරාජසිංහම් ඝාතනය, 2005 | |
|---|---|
| 2005 දෙසැම්බර් 24 | දෙමළ ජාතික සන්ධානයේ දේශපාලනඥයකු සහ දෙමළ ජාතික සන්ධානයේ (ටී.එන්.ඒ) හි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ජෝෂප් පරරාජසිංහම් මහතා මඩකලපුවේ ශාන්ත මරියා ආසන දෙව්මැදුරේ දී නාඳුනන තුවක්කුකරුවන් දෙදෙනෙකු විසින් වෙඩිතබා ඝාතනය කරන ලදි. |
| 2015 ඔක්තෝම්බර් 11 | පිල්ලෙයාන්, හිටපු පාර්ලමේන්තු මන්ත්‍රී ජෝෂප් පරරාජසිංහම් ඝාතනය සම්බන්ධයෙන් රහස් පෙලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි. අනෙකුත් සැකකරුවන් දෙදෙනා වන මඩකලපුවේ පදිංචි ක්‍රිෂ්ණා කන්දරාජා නොහොත් ප්‍රදීප් මාස්ටර් සහ රෙන්ගසාමි කනයාගමා නොහොත් කාජන් මාමා ද අත්අඩංගුවට ගනු ලැබීය. |
| 2018 ජනවාරි 04 | පිල්ලෙයාන් සහ ඔහුගේ සගයන් කිහිපදෙනෙකු මඩකලපුවේ මහාධිකරණයේ පෙනී සිටිය හ. |
| 2019 ජනවාරි මස 13 | ජෝෂප් පරරාජසිංහම් ඝාතන නඩුවේ ප්‍රධාන සැකකරුවන් දෙදෙනාගේ පාපොච්චාරණයන් ස්වේච්ඡාවෙන් කළ බව හා එකී සාක්ෂි අනුකූල වන බව මඩකලපු මහාධිකරණයේ දී පිළිගන්නා ලදි.<br><br>රෙන්ගසාමි කනගනායගම් හෙවත් කජන් මාමා සහ එඩ්වින් සිල්වා ක්‍රිෂ්ණන්දරාජා හෙවත් ප්‍රදීප් මාස්ටර්ගේ පාපොච්චාරණය ඉදිරිපත් කිරීමට විනිසුරු එම්.වයි.එම්. ඉර්ෂඩීන් අවසර ලබාදෙන ලදි. පැරාම්පිටරි නායක සහ නැගෙනහිර පළාතේ හිටපු මහ ඇමති සිවනේසතුරෛ චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥයන් විසින් මෙම ඝාතනයට පිල්ලෙයාන්ව සම්බන්ධ කරන ලද එකී පාපොච්චාරණය වැරදි බව ඔප්පු කරමින් එය බණ්ඩනය කරන ලදි. මෙම නඩුව අභියාචනාධිකරණයේ ද්විපුද්ගල විනිසුරු මඩුල්ලක් වෙත අභියාචනා කරන ලදි. මෙම නඩුව අභියාචනාධිකරණයේ ද්විපුද්ගල විනිසුරු මඩුල්ලක් වෙත අභියාචනා කරන ලදි. |
| 2020 ජනවාරි 22 | දෙමළ ජාතික සන්ධානයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම් ඝාතනය සම්බන්ධයෙන් වන පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා වන නඩුව 2020 පෙබරවාරි 25 වන දා දක්වා කල්තබන බව තීරණය කරන ලදි. |
| 2020 මාර්තු 12 | නැගෙනහිර පළාතේ හිටපු මහ ඇමති සිවනේසතුරෛ චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් හට රිමාන්ඩ් භාරයේ සිටිය දී මහ මැතිවරණයට තරගකිරීම සඳහා අවසර ලබාදෙන ලදි. |

[64] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය' නිදර්ශනාත්මක සිද්ධි හතක් විමසාබැලීම, යොමුව https://www.cpalanka.org/the-needfor-accountability-in-sri-lankas-criminal-justice-system/ 2020 නොවැම්බර් 23 වන දින ප්‍රවේශ විය.

| | |
|---|---|
| 2020 මැයි 11 | දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී දිවංගත ජෝෂප් පරරාජසිංහම් මහතා ඝාතනයට සම්බන්ධ යැයි සැකපිට රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින නැගෙනහිර පළාතේ හිටපු මහ ඇමති සහ තමිල් මක්කල් විඩුතලෛ පුලිකල් (ටී.එම්.වී.පී) පක්ෂයේ නායක ශිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන්ට එරෙහිව පවරා ඇති නඩුව ජූලි 27 වන දින විභාගයට ගැනීමට තීරණය විය. |
| 2020 අගෝස්තු 18 | 2020 වර්ෂයේ අගෝස්තු මස 05 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරී පත් වූ ශිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් හට නව පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය හා අනාගත සැසිවාරයන්ට සහභාගී වීම සඳහා මඩකලපුව මහාධිකරණයෙන් නිවාඩු ලබාදෙන ලදි. |
| 2020 සැප්තැම්බර් 22 | මඩකලපු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරයා වශයෙන් පිල්ලෙයාන් පත්කරන ලදි. |
| 2020 නොවැම්බර් 14 | පාපොච්චාරණය අවේශ්‍ය නොවන බව අභියාචනාධිරණය ප්‍රකාශ කරන ලදි. පාපොච්චාරණයට අදාළ ප්‍රකාශය පළමුව සිදුකරන අවස්ථාවේ දී විනිසුරුවරයා විසින් පළමු විත්තිකරුට ප්‍රකාශ කර තිබෙනුයේ එම ප්‍රකාශය ඔහුට ප්‍රයෝජනවත් හෝ අගතිගාමී වියහැකි බවයි. මෙය "පෙළඹවීමක් හෝ තර්ජනයක්" ලෙස ගත හැකිබව ප්‍රකාශ කරන ලදි. |
| 2020 නොවැම්බර් 24 | පාපොච්චාරණය ආවේශ්‍ය නොවන බවට සැළකීමත් සමඟම, මඩකලපුව මහාධිකරණය විසින් සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් හට ඇප ලබාදෙන ලදි. නඩුව ඉදිරියට ගෙනයාමට අදහස් කරනවාද නැද්ද යන්න පිළිබඳව තීරණයකට එළඹීම සඳහා අධිකරණය විසින් නීතිපතිවරයාට කාලය ලබාදෙන ලදි. |
| 2021 ජනවාරි 11 | හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම් ඝාතනය සම්බන්ධයෙන් පිල්ලෙයාන්ට එරෙහි නඩුව ඉවත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව තීරණය කරන ලදි. නීතිපති දෙපාර්තමේන්තුව විසින් එකී තීරණය මඩකලපුව මහාධිකරණයට දැනුම් දෙන ලද බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම් නිරාශා ජයරත්න මෙනවිය ප්‍රකාශකරන ලදි. |
| 2021 ජනවාරි 13 | හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසංහම් ඝාතනයට අදාළව සැකපිට චෝදනා ලබාසිටි පිල්ලෙයාන් ඇතුළු තවත් සැකකරුවන් සිව්දෙනෙකු නිදොස් කොට නිදහස් කරන ලදි. නඩුව නිෂ්ප්‍රභ කරන ලෙස මඩකලපු මහාධිකරණ විනිසුරු එස්. සුසයිදාසන් මහතා නියෝග කරන ලදි. |

| 2. 'ත්‍රිකුණාමල පස්දෙනාගේ නඩුව': දෙමළ ශිෂ්‍යයන් පස්දෙනෙකු ඝාතනය කිරීම, 2006 | |
|---|---|
| 2019 ජූලි 3 | ත්‍රිකුණාමල ප්‍රධාන මහේස්ත්‍රාත් එම්. හන්සා මහතා විසින් ට්‍රින්කෝ ශිෂ්‍ය ඝාතන නඩුවේ සැකකරුවන් වූ විශේෂ කාර්ය බලකා (එස්.ටී.එෆ්.) සාමාජිකයන් නිදොස් කොට නිදහස් කරන ලදි. |
| 2019 ජූලි 19 | ත්‍රිකුණාමලය සිසුන් පස්දෙනෙකු ඝාතනය සම්බන්ධ නඩුව සම්බන්ධයෙන් අළුතින් විමර්ශන ආරම්භ කරන ලෙසට වැඩබලන පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතාට නීතිපතිවරයා උපදෙස් ලබාදුන් අතර නඩුවේ සාක්ෂිකරුවන් සිටින ප්‍රදේශ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට උපදෙස් ලබාදෙන ලදි. මෙම නඩුවේ බොහෝ සාක්ෂිකරුවන් විදේශ ගතව ඇතැයි විශ්වාස කෙරේ. |

| 3. ඇක්ෂන් අගේන්ස්ට් හන්ගර් සංවිධානයේ සේවකයන් ඝාතනය කිරීම, 2006 | |
|---|---|
| 2019 ජුනි 13 | නීතිපති දප්පුල ද ලිවේරා ඇක්ෂන් අගේන්ස්ට් හන්ගර් සංවිධානයේ සේවකයින් සමූල ඝාතනය පිළිබඳ පරීක්ෂණ වේගවත් කරන ලෙස නියෝග කරන ලදි. |

| 4. කීත් නොයාර් පැහැරගැනීම, 2008 | |
|---|---|
| 2019 ජුනි 11 | කීත් නොයාර් පැහැර ගැනීම සම්බන්ධයෙන් හිටපු යුධහමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර සහ චන්ද්‍රහා ජයසිංහ වෙත පනවා තිබූ ඇප කොන්දේසි අවලංගු කරන ලෙසට ගල්කිස්ස අතිරේක මහේස්ත්‍රාත් සී.එච්.ජී. ලියනගේ මහතා නියෝග කරන ලදි. |
| 2019 අගෝස්තු 23 | කීත් නොයාර් පැහැර ගැනීම සම්බන්ධයෙන් හමුදා බුද්ධි අංශ සැරයන් චාමික සුමිත් කුමාර මහතා අත්අඩංගුවට ගන්නා ලදි. |
| 2019 සැප්තැම්බර් 12 | මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගැනීම සම්බන්ධයෙන් වූ විමර්ශනයන් සම්බන්ධයෙන් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය පිළිබඳව විමර්ශනයක් පවත්වන ලෙස නීතිපතිවරයා විසින් වැඩබලන පොලිස්පතිවරයාට නියෝග කරන ලදි. |
| 2019 සැප්තැම්බර් 22 | හිටපු නියෝජ්‍ය කර්තෘ කීත් නොයාර් පැහැරගෙන ගොස් පහරදීම සම්බන්ධයෙන් විමර්ශය කිරීම සඳහා මෙරට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (සී.අයි.ඩී) විසින් ඇමරිකානු ෆෙඩරල් විමර්ශන කාර්යාංශයේ සහාය ලබාගැනීමට නියමිත ය. |
| 2020 සැප්තැම්බර් මස 01 | රාජ්‍ය නිලධාරීන්ට සිදුවූ දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබලන කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් විශ්‍රාමලත් යුධහමුදා නිලධාරී මාණ්ඩලික සැරයන් සෝමසූරිය මහතා පැවසුයේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් හිටපු ආරක්ෂක ලේකම් මෙන්ම වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ උපදෙස් මත මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගෙන ගොස් දොම්පේ නිවසක රඳවාගෙන තැබූ බව පවසන ලෙසට තර්ජනය කරන ලද බව ප්‍රකාශ කරන ලදි.<br><br>එමන්ම ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ බවත් එහි දී එහි නිලධාරීන් විසින් පහරදුන් බවත් ඉන් අනතුරුව සෝමසූරියව ඔහුගේ නිවසට |

| | |
|---|---|
| | කැඳවාගෙන ගොස් ඔහුගේ බිරිඳගෙන් ද ප්‍රශ්න කරන ලද බවත් ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලදි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ “එවැනි ප්‍රකාශයක් කිරීමට අපොහොසත් වුවහොත් මාගේ විශ්‍රාම වැටුප අහිමි වන බවත් මාගේ දරුවන්ගේ අනාගතයට එය බලපාන බවත්” පවසමින් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා ඔහුට තර්ජනය කරන ලද බවත් එවන් ප්‍රතිවිපාකයන් ඇතිවේ යන බිය හේතුවෙන් තමන් එසේ ප්‍රකාශ කිරීමට එකඟ වූ බවත් ය.<br><br>ඉන්පසුව සෝමසූරිය මහතා ඔහු විසින් කුලියට ගත් දොම්පේ නිවසට රැගෙන ගිය බවත් එහි දී පැවසූ සියලු දේ සඳහා එකඟවන ලෙස පවසමින් නිශාන්ත සිල්වා ඇතුළු පිරිසි විසින් එකී සියල්ල පටිගත කරන ලද බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලදි.<br><br>“පසුව මාව නිශාන්ත සිල්වාගේ උපදෙස් මත ලෝචන අබේවික්‍රම විසින් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරිය ඉදිරියට රැගෙන ගොස් කීත් නොයාර් පැහැරගෙනයාම සම්බන්ධව ප්‍රකාශයක් ලබාදෙන ලෙසට පැවසූවත් මම එහි දී අබේවික්‍රමට කීවා මම එවන් සිදුවීමකට සම්බන්ධ නැති බවත් එසේ කිරීම සඳහා ගෝඨාභය රාජපක්ෂ හෝ බුලත්වත්ත නම් නිලධරයා මා හට උපදෙස් ලබානොදුන් බවත්”, කී බව ඔහු ප්‍රකාශ කරන ලද අතර කෙසේ වෙතත් ඔහු නිශාන්ත සිල්වා හට සිල්වා විසින් ලබාදුන් උපදෙස් අනුව ක්‍රියාකරන ලද බව ප්‍රකාශ කරන ලද බවයි. |

| 5. අතුරුදහන් වූ එකොළහ: තරුණයන් එකොළොස් දෙනෙකු පැහැර ගැනීම, 2008/09 | |
|---|---|
| 2018 සැප්තැම්බර් 23 | නාවික හමුදාව විසින් සිදුකරන ලද පැහැරගැනීම සම්බන්ධ සිද්ධියේ දී සාක්ෂි ලබාදෙන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) සාක්ෂිකරු වූ ලුතිනන් කමාන්ඩර් ක්‍රිෂාන් වෙලගෙදර පීඩාවලට මුහුණ දෙන ලදි. |
| 2019 ජුනි 14 | තරුණයන් 11 දෙනෙකු පැහැරගෙනයාමේ සිද්ධියේ දී සැකකරුවන් දෙදෙනෙකු ඇප මත මුදාහැර තිබේ. |
| 2019 ජූලි 7 | නාවික හමුදාව විසින් සිදුකරන ලද පැහැරගැනීම් නඩුව විභාග කරනු ලබන අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (සී.අයි.ඩී) විමර්ශකයින් පවසනුයේ මෙම තරුණයින් පැහැරගැනීම සම්බන්ධව හිටපු නවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සතුව දැනුම්වත්භාවයක් ඇති බවයි. |
| 2019 අගෝස්තු 7 | ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් වසන්ත කරන්නාගොඩ වෙත උසස් වීමක් ලබාදෙන ලදි, 2008-2009 කාල සීමාව තුළ දී ඔහුගේ බුද්ධි අංශ නිලධාරීන් විසින් පැහැරගෙන ගොස් නීතිවිරෝධී ලෙස රඳවාගෙන සිටි තරුණයන් 11 දෙනෙකු ඝාතනය කිරීමේ චෝදනාවට ලක් වූ සැකකරුවකු නාවික හමුදාවේ අද්මිරාල් ධුරයට උසස් කර ඇත. |

| | |
|---|---|
| 2019 අගෝස්තු 21 | තරුණයන් 11 දෙනෙකු පැහැරගෙන යාමේ චෝදනාවට ලක් වූ නාවික හමුදා නිලධාරීන් උසස් කිරීම කණගාටුවට කරුණක් වන බව අධිකරණය ප්‍රකාශ කරන ලදි. මෙම නඩුව මීට පෙර කොළඹ කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක ඉදිරියේ සළකා බැලූ අවස්ථාවේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා අධිකරණයට ඉදිරියේ ප්‍රකාශ කරන ලද්දේ අගතියට පත් වූ පාර්ශවයන් හට සාධාරණයක් ඉටු විය යුතු බවයි. |
| 2020 ජනවාරි 22 | හිටපු නාවික හමුදාපති රියර් අද්මිරාර් වසන්ත කරන්නාගොඩ, රියර් අද්මිරාල් ඩී. කේ. පී. දසනායක සහ කොමදෝරු සම්පත් මුණසිංහ රණසිංහ විසින් ව්‍යාජ හා ගොතන ලද සාක්ෂි මත පදනම් වෙමින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් ලබාදුන් තීන්දුවට එරෙහිව දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත පැමිණිලි කරන ලදි. |
| 2020 ජනවාරි 28 | හිටපු නාවික හමුදාපති රියර් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ හා හිටපු නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශක ඩී.කේ.පී දසනායක මහතාට විරුද්ධව පවරා ඇති නඩුව පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් නිගමනයට පැමිණෙන තුරු අත්හිටුවන ලෙසට පසුගිය පාලන සමයේ (2015-2019) සිදුකරන ලද දේශපාලන පළිගැනීම් පිළිබඳව පරීක්ෂා කිරීමේ ජනාධිපති පරීක්ෂන කොමිෂන් සභාව විසින් නීතිපතිවරයා වෙත නියෝග කරන ලදි. |
| 2020 ජනවාරි 29 | 2008 සහ 2009 වර්ෂයන්හි දී පුද්ගලයන් එකොළොස් දෙනෙකු පැහැරගෙන යාම සම්බන්ධයෙන් නීතිපතිවරයාට ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මත කටයුතු කිරීමෙන් වළකින ලෙසට තමා වෙත නියෝග කිරීම සඳහා දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත නෛතික හෝ ව්‍යවස්ථාපිත බලයක් නොමැති බව නීතිපති ජනාධිපති නීතීඥ දප්පුල ද ලිවේරා මහතා කොමිෂම වෙත දැනුම්දෙන ලදි. |
| 2020 පෙබරවාරි 07 | 2015 ජනවාරි මස 08 වන දිනෙන් ආරම්භව 2019 නොවැම්බර් මස 16 දිනෙන් අවසන් වූ මෙම කාලසීමාව තුළ දී සිදුකරන ලද දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබලන ජනාධිපති කොමිෂන් සභාව වෙත ලබාදුන් ඇතැම් බලතල අභියෝගයට ලක් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කරන ලදි. |
| 17-18 පෙබරවාරි 2020 | දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබලන ජනාධිපති කොමිෂන් සභාව හමුවේ පෙර පෙනී සිටි නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ හට නැවතත් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලෙසට සිතාසි නිකුත් කරන ලදි. එමෙන්ම රියර් අද්මිරාර් ඩී.කේ.පී දසනායක මහතා ද කොමිෂන් සභාව හමුවේ පෙනීසිටිමින් ඔවුන් විසින් ගොනු කළ පෙත්සමට අදාළව සාක්ෂි ලබාදෙන ලෙස නියෝග කරන ලදි.<br><br>දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීම සඳහා පත්කරන ලද ජනාධිපති කොමිෂන් සභාව හමුවේ පෙනී සිට වාචික සාක්ෂි දෙමින් කරන්නාගොඩ මහතා ප්‍රකාශ කරන ලද්දේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට සහ ඔහුට විරුද්ධව විවිධ සාක්ෂිකරුවන් වෙත බලපෑම් කිරීම මගින් මෙකී සාපරාධී චෝදනා එල්ල කරන ලද බවයි.<br><br>කරන්නාගොඩ මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර හා හිටපු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා යන මහත්වරුන් පසුගිය රජයේ නියෝගයන් මත රණවිරුවන් |

| | |
|---|---|
| | දඩයම් කිරීම සිදුකරන ලද බවයි. එවන් ක්‍රියා ජාතික ආරක්ෂාව කෙරේ බරපතල ලෙස බලපෑ බවත් පාස්කු ඉරුදින ත්‍රස්ත්‍ර ප්‍රහාරයට ද එය හේතු වූ බවයි.<br><br>හිටපු අමාත්‍ය මංගල සමරවීර විසින් ඇමරිකා එක්සත් ජනපදය සමඟින් ගිවිසුමකට එළඹෙමින් ත්‍රස්තවාදීන්ගෙන් රට මුදාගැනීම සඳහා වූ හමුදා මෙහෙයුම්, යුධ අපරාධ බවට චීත්තු ගන්වා ඇති බව කරන්නාගොඩ ප්‍රකාශ කරන ලදි. ඔහු වාචික සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ හිටපු ආරක්ෂක ලේකම්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ත්‍රස්තවාදීන්ට එරෙහි යුද්ධයේ යෙදී සිටි අනෙකුත් ප්‍රධාන පුද්ගලයන් පසුගිය රජය විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත ගෙන යාමට උත්සාහ කරන ලද බව ප්‍රකාශ කරන ලදි. |
| 24 පෙබරවාරි 2020 | 2008 සහ 2009 වර්ෂයන්හි දී පුද්ගලයන් එකොළොස් දෙනෙකු පැහැරගැනීම සම්බන්ධයනේ ගොනු කර ඇති අධිචෝදනා පත්‍ර සම්බන්ධයෙන් හිටපු නාවික හමුදාපති අද්මිරාල්, වසන්ත කරන්නාගොඩ වෙත නැවත සිතාසි නිකුත් කරන ලෙසට කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල විසින් නියෝග කරන ලදි.<br><br>දේශපාලන පළිගැනීම් සොයාබැලීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ වාචික සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කරන ලද්දේ, ඔහු සිය පශ්චාත් උපාධිය හදාරමින් සිටින අතරතුර පසුගිය රජය විසින් ඔහුව නැවත මෙරටට කැඳවා නොගත්තේ නම් ඔහුට අප්‍රේල් 21 පාස්කු ඉරු දින සිදුවූ ත්‍රස්ත ප්‍රහාර වළක්වා ගැනීමට ද හැකියාවක් ලැබෙන බව දසනායක පෙන්වා දෙන ලදි. ඩී.කේ.පී දසනායක තවදුරටත් පෙන්වාදෙන ලද්දේ 2014 සැප්තැම්බර් මස 14 වන දින ඔහු ඇමරිකාවෙන් පැමිණි බවත් ඔහු එහි දී ත්‍රස්ත්‍රවාදය වැළැක්වීම පිළිබඳ ප්‍රතිපත්ති හා උපායමාර්ග පිළිබඳව පශ්චාත් උපාධියක් හදාරමින් සිටින ලද බවත් එහි විශේෂ වැඩසටහනක් වශයෙන් ඉස්ලාම් අන්තවාදයට විරුද්ධ වීම අන්තර්ගතව තිබූ බව ද පෙන්වා දෙන ලදි.<br><br>යහපාලන රජය තේරී පත් වූ පසු, එවකට ආරක්ෂක කවුන්සිලය ගත් තීරණයකට අනුව එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහගේ උපදෙස් පරිදි නැවත මෙරටට පැමිණෙන ලෙස නාවික හමුදාපති වයිස් අද්මිරාල් ජයන්ත පෙරේරා ඔහුට දැනුම් දුන්නේ ය.<br><br>දින 14 ක අධ්‍යාපන නිවාඩුවක් මත ආපසු මෙරටට පැමිණි බැව් අනතුරුව 2015 පෙබරවාරි 19 වන දින ඔහුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරියේ පෙනී සිටිමින් 2008 සහ 2009 වර්ෂයන් හි තරුණයන් එකොළොස් දෙනෙක් පැහැරගැනීම හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සම්බන්ධව ප්‍රකාශයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ඔහු ප්‍රකාශ කරන ලදි.<br><br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපති නිශාන්ත ද සිල්වා මහතා දසනායක මහතාගේ සාක්ෂිය වාර්තා කිරීමේ කාර්යයට වඩා මොසමක් ඉදිරිපත් කර දිසානායක වන ඔහුට විරුද්ධව විදෙස් ගමන් තහනමක් ලබාගන්නා ලද බව දිසානායක මහතා ප්‍රකාශ කළේ ය. එකී සංචාරක තහනම ඉවත් කරන ලෙසට ඔහු විසින් බහුවිධ ඉල්ලීම් සිදුකරන ලද නමුත් ඒවා අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදි. මෙම තත්ත්වය එක්සත් ජනපදයේ දිවිගෙවන තම බිරිඳ හා දරුවන් දෙදෙනා හට බරපතල මානසික ආතතියක් එක්කරන ලද බව ද හෙතෙම ප්‍රකාශ කරන ලදි.<br><br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා දසනායකගේ බිරිඳ හා දරුවන් වෙත බලපෑම් කරමින් ඔහුව රජයේ සාක්ෂිකරුවකු කිරීමට ද උත්සාහ ගන්නා ලද බව ඔහු ප්‍රකාශ කළේ ය. මේ සඳහා ඔහු විසින් නාවික හමුදාවේ අණදෙන නිලධාරී මෙන්ම හිටපු නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ හා හිටපු ආරක්ෂක ලේකම් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ යටතේ ක්‍රියාත්මක වූ GOTA නම් කඳවුරක් මේ සඳහා යොදාගත් බව ප්‍රකාශ කිරීම සඳහා ඔහුට බලකරන ලද බවයි. |

| | |
|---|---|
| 03 මාර්තු 2020 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ අමාත්‍ය රන්ජන් රාමනායක අතරේ සිදුවූවා යැයි සැළකෙන දුරකථන සංවාදයක් ද රියර් අද්මිරාල් දසනායක විසින් ලබාදෙන ලදි. සහකාර පොලිස් අධිකාරී බී.එස් තිසේරා අද දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනි නොසිටින බව ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතීඥයන් විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ කරන ලදි. |
| 24 ජුනි 2020 | නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ විසින් ඔහුට විරුද්ධව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ ගොනු කර ඇති අධිචෝදනා අභියෝගයට ලක්කරමින් අභියාචනාධිකරණය වෙත අභියාචනා කරන ලදි. |
| 25 ජුනි 2020 | අභියාචනාධිකරණය විසින් නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩට එරෙහිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ ගොනු කර ඇති අධිචෝදන වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් ලබාදෙන ලදි. |
| 01 ජූලි 2020 | රියර් අද්මිරාල් ඩී. කේ. පී. දසනායක මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත කැඳවන ලදි. දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි රියර් අද්මිරාල් දසනායක මහතා කියාසිටියේ තරුණයින් 11 දෙනෙකු පැහැරගෙන ගොස් ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඔහුව දේශපාලනික වශයෙන් වූ පෙළඹවීමක් මත අත්අඩංගුවට ගන්නා ලද බවත් එසේ ඔහුට විරුද්ධව අධිචෝදනා ගොනු නොකළේ නම් ඔහුට ලබාගත හැකිව තිබූ නමුදු නොලැබුණු උසස්වීම් රාශියක් ලබාගැනීමට හැකියාව තිබුණු බවත් එපමණක් නොව ඔහුට නාවික හමුදාපති ලෙස පත්කිරීමට ද හැකියාව තිබුණු බව පෙන්වාදුනි. එමෙන්ම ඔහු පෙන්වාදුන් පරිදි ඔහුගේ පැමිණිල්ලේ වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇති මෙ ම පුද්ගලයන් දෙදෙනා විසින් ඔහුව නාවික හමුදා මූලස්ථානයේ සිට අපදා කළමණාකරණ මධ්‍යස්ථානය දෑ අවුරුද්දක් සඳහා මාරු කිරීම පිළිබඳව මීට පෙර සාකච්ඡා කර ඇති බවත් ඔහු විසින් ඉටු කළ යුතු කාර්යයන් වලින් පිටත කාර්යයක් සිදුකිරීම සඳහා ලබාදීම මගින් ඔහුගේ වෘත්තියට හා කීර්තියට එය බලපා ඇති බවත් ය.<br><br>දසානායක තවදුරටත් පැවසුයේ ඔහුට එරෙහිව පියවර ගන්නා ලද කාල සීමාව තුළ ඔහු කොමදෝරුවරයෙක් ලෙස උසස් කිරීමට නියමිතව තිබූ නමුත් එවැනි පරීක්ෂණ නිසි උසස්වීම් සඳහා බලනොපාන බවට නීතිපතිවරයා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කර තිබිය දීත් එම නියෝග නොතකමින් කරනු ලබූ පරීක්ෂණ හේතුවෙන් එකී උසස්වීමට බාධාවක් වූ බව පෙන්වා දෙන ලදී. පසුව දසානායක තාවකාලික කොමදෝරුවරයෙක් වශයෙන් පත්කරන ලදි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙන් 2019 ජනවාරි 17 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හේමසිරි ප්‍රනාන්දු වෙත නිර්දේශ කරමින් දන්වා තිබෙනුයේ ඔහුට විරුද්ධව නඩුවක් විභාගවෙමින් පවතින බැවින් උසස්වීම සිදුනොකළ යුතු බවයි.<br><br>ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරමින් පෙන්වාදෙන ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමාට විරුද්ධව ඉදිරිපත් කරන ලද ප්‍රධාන සාක්ෂිය වනුයේ සිද්ධිය සිදු වූ කාල සීමාව තුළ ඔහු ප්‍රධාන සැකකරුවන් දෙදෙනෙකු වන කමාන්ඩර් සුමිත් රණසිංහ සහ ලුතිනන් කමාන්ඩර් ප්‍රසාද් හෙට්ටිආරච්චි යන අයගේ අධීක්ෂණ නිලධාරියා වන බවයි. කෙසේ වෙතත් ඔහු ඔවුනගේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටුයතු නොකළ බව දිසානායක සඳහන් කරන ලදි. රියර් අද්මිරාල් දිසානායක වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරයා විසින් සිද්ධිය වූ අවස්ථාවේ දී දිසානායක ඉහත සඳහන් නිලධාරීන්ගේ අධීක්ෂණ නිලධරයා නොවූ බවට සනාථ කරමින් නාවික හමුදා මූලස්ථානය විසින් ලබාදෙන ලද ලිපියක් අධිකරණය වෙත ඉදිරිපත් කර ඒ බව සනාථ කරන ලදි. |

| | |
|---|---|
| | අපරාධ දෙපාර්තමේන්තුවට අනුයුක්ත ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා මහතා විසින් මෙම නඩුව විභාගයට ගැනීමට පෙර රාමනාය වෙත විමර්ශන තොරතුරු නීතිවිරෝධී ලෙස ලබා දී ඇති බවත් දසනායක තවදුරටත් පවසන ලදි. අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා ද මෙම නඩුව සම්බන්ධයෙන් රාමානායක මහතා සමගින් සංවාද පවත්වා ඇති බවත් පෙන්වාදෙන ලදි. |
| ජූලි 03 2020 | කොමිසම හමුවේ සාක්ෂි දසනායක මහතා ප්‍රකාශ කර සිටියේ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ හට පැහැරගැනීමේ සිද්ධියට චෝදනා එල්ල කිරීම සඳහා තමාව සාක්ෂිකරුවකු ලෙස යොදාගැනීම සඳහා උත්සාහයක් තිබුණු බවයි. එම උත්සාහය අසාර්ථක වීමෙන් පසුව ඔහුට විරුද්ධව බොරු චෝදනා එල්ලකර ඇති බවත් දසනායක මහතා සඳහන් කරන ලදි.<br><br>අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ විමර්ශන කණ්ඩායමක් විසින් හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ විසින් යුධ අපරාධ කරන ලද බව ඔප්පු කිරීමට උත්සාහ කරන ලද බව ඔහු ප්‍රකාශ කරන ලදි. නාවික හමුදාවේ අණදෙන නිලධාරී ට්‍රැවිස් සින්නයියා විසින් ලබාදුන් ව්‍යාජ සාක්ෂි මත තමා අත්අඩංගුවට ගත් බව ද දසනායක මහතා පැවසීය.<br><br>දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාවේ සභාපති විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා විසින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රන්ජන් රාමනායක, දොස්තර රාජිත සේනාරත්න, ඩී. එම්. ස්වාමිනාදන්, රන්ජිත් මද්දුම බණ්ඩාර සහ අජිත් පී. පෙරේරා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වන රවි විද්‍යාලංකාර සහ රවී සෙනෙවිරත්න සහ ජනාධිපති නීතිඥ ජේ.සී වැලිඅමුණ යන අය පැමිණිල්ලේ වගඋත්තරකරුවන් ලෙස නම්කරමින් නොතීසි යැවීමට උපදෙස් දෙන ලදි. |
| 2020 අගෝස්තු 10 | හිටපු අමාත්‍ය රන්ජිත් මද්දුම බණ්ඩාර, රාජිත සේනාරත්න, අජිත් පී. පෙරේරා සහ රන්ජන් රාමනායක යන අය දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියහ. |
| 2020 අගෝස්තු 26 | අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර සහ පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් කියාසිටියේ ඔවුනට සාක්ෂි ලබාදීමට තවත් කාලයක් ලබාදෙන ලෙස ය.<br><br>මේ අතර, මෙම පැමිණිල්ලට වගඋත්තරකරුවකු වශයෙන් නම් කර ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්නව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී රන්ජන් රාමනායක ඇතුළු දේශපාලනඥයන් සහභාගී වූ සාකච්ඡාවක් සඳහා සහභාගී වී ඇති අතර එහි දී තරුණයින් 11 දෙනෙකු පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම පිළිබඳ විමර්ශන වලදී ඇති වූ බාධා සම්බන්ධයෙන් වූ සාකච්ඡා වී ඇති අතර එසේ හෙයින් එකම පැමිණිල්ලේම වගඋත්තරකරුවකු ලෙස නම්කර තිබුණි, දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ඔහු කියා සිටියේ එම රැස්වීමට දේශපාලනඥයින් පැමිණ සිටිය ද තම රාජකාරිය මත වූ බාධාවන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද බව කියා සිටියේ ය.<br><br>මේ සම්බන්ධයෙන් දසනායක මහතා වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා ප්‍රකාශකරන ලද්දේ, එවන් බාධාවක් තිබේ නම් එය අධිකරණයට ඉදිරිපත් කළයුතු වන බවත් අවශ්‍ය නම් නීතිපතිවරයාගේ මතය ලබාගත යුතු බවත්, ඒ අයුරින් ක්‍රියානොකර සෙනෙවිරත්න මහතා විසින් දේශපාලනඥයන් අතර නඩුව පිළිබඳ |

| | |
|---|---|
| | කතා කළ බවත් දසනායකගේ නීතිඥවරයා ප්‍රකාශ කරන ලදි.<br><br>දසනායක මහතා එවකට ඔහු රැඳී සිටි නාවික හමුදා මූලස්ථානයේ රැඳී සිටියේ නම් පරීක්ෂණ වලට බාධාවක් වනු ඇති බැවින් ඔහු මාරුකළ යුතු වන බවත් සෙනෙවිරත්න මහතා රැස්වීමේ දී ප්‍රකාශ කර ඇති බව නීතිඥවරයා සඳහන් කරන ලදි. එම නඩුවේ සාක්ෂිකරුවන් ද නාවික හමුදා මූලස්ථානයේ රැඳී සිටි බැවින් එකී මූලස්ථානයේ ම දසනායක රැඳී සිටීම බාධාවක් වූ බව සෙනෙවිරත්න සඳහන් කරන ලදි. |
| 2020 සැප්තැම්බර් 15 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර, පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා සහ තවත් නිලධාරීන් කිහිපදෙනෙකු යහපාලන රජය කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුවට ව්‍යාජ සාක්ෂි ඉදිරිපත් කරන ලද බව දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීමේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදෙමින් කමාන්ඩර් ආර්. සුමිත් රණසිංහ පෙන්වා දෙන ලදි. ඔහු තවදුරටත් සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කරන ලද්දේ යුධ අපරාධ කරන ලද බව කියමින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් යුද්ධය අවසන් කළ දේශපාලන නායකත්වයට අපහාස කිරීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද කුමන්ත්‍රණයක ප්‍රතිඵල වශයෙන් ඔහු ඇතුළු තවත් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගන්නා ලද බවයි.<br><br>එමෙන්ම කමාන්ඩර් සුමිත රණසිංහ පෙන්වාදෙන ලද්දේ ඔහු එවකට නාවික හමුදාවේ සේවය කරන විට ඕස්ට්‍රේලියාව වෙත මිනිසුන් ජාවාරම් කළ බවට සම්බන්ධ තොරතුරු ලැබීමෙන් අනතුරුව ඊට සම්බන්ධ සැකකරන ලද ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර නම් නිලධාරියෙකු සම්බන්ධව විමර්ශන කළ බවයි. ඉන් අනතුරුව ඔහු විසින් කමාන්ඩර් සුමිත් රණසිංහට විරුද්ධව පළිගැනීමක් කරන ලද බව සුමිත් රණසිංහ ප්‍රකාශ කරන ලදි. එමෙන්ම යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව ඔහුට එරෙහිව ව්‍යාජ සාක්ෂි ගොනුකිරීම සඳහා කමාන්ඩර් වෙලේගෙදර යොදාගන්නා ලද බවද ඔහු සඳහන් කරන ලදි. |

| 6. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය, 2009 | |
|---|---|
| 2019 අප්‍රේල් 04 | ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය සම්බන්ධයෙන් ඔහුගේ දියණිය අහිම්සා වික්‍රමතුංග විසින් ඇමරිකා එක්සත් ජනපදයේ සිවිල් නඩුවක් පවරන ලදි. |
| 2019 ඔක්තෝම්බර් 21 | මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය අහිම්සා වික්‍රමතුංග විසින් පවරන ලද සිවිල් නඩුව එක්සත් ජනපදයේ කැලිෆෝනියා දිස්ත්‍රික් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර එම නඩුව තවදුරටත් ඉදිරියට ගෙනයාම ප්‍රතික්ෂේප කරන ලදි. |
| 2019 නොවැම්බර් 13 | ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍යවේදියකු වූ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීමේ නඩුව සම්බන්ධව ඇමරිකා එක්සත් ජනපදයේ දිස්ත්‍රික් උසාවියේ තීන්දුව මඟින් ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා හට මුක්තිය ලබාදීම සම්බන්ධවත් එකී තීන්දුව අහෝසි කරන ලෙසත් ඉල්ලා ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය අහිම්සා වික්‍රමතුංග සහ ඇගේ නීතිඥයන් විසින් ඇමරිකාවේ නව වන චක්‍රීය අභියාචනාධිකරණය වෙතට අභියාචනයක් ඉදිරිපත් කරන ලදි. |

| | |
|---|---|
| 2019 නොවැම්බර් 16 | ගෝඨාභය රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස තේරී පත්විය. එක්සත් ජනපද අධිකරණයක ඔවුනට විරුද්ධව අභියාචනයක් විභාගවෙමින් පවතින අතරතුර විදේශ රාජ්‍ය නායකයකු තේරී පත් වූ පළමු අවස්ථාව මෙය වේ. ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ හට රාජ්‍ය ප්‍රධානියාට හිමි විනිර්මුක්තිය සඳහා සුදුසුකම් ලබා ඇත. |
| 2019 දෙසැම්බර් 20 | අභියාචනය මධ්‍යයේ නඩුවක් විභාගයට ගත්විට යම් සැක සහිත තත්ත්වයක් පවතී නම් එහි දී පහළ අධිකරණයේ තීන්දුව ඉවත දැමීමට ඉඩ ලබාදෙනු ලබන මුන්සිංවෙයාර් මූලධර්මය යටතේ අහිම්සා වික්‍රමතුංගගේ සහ ඇගේ නීතිඥ කණ්ඩායම විසින් අදාළ අභියාචනය නිෂ්ප්‍රභ කරන ලෙසට ඉල්ලා මෝසමක් ගොනු කරන ලදි. |
| 2020 පෙබරවාරි 15 | මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් සාක්ෂි වසන් කිරීමේ චෝදනාව මත දකුණු කොළඹ කොට්ඨාශ භාර හිටපු නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න නානායක්කාර වෙත පනවා තිබූ සංචාරක තහනම ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඉවත්කරන ලදි. |
| 2020 පෙබරවාරි 21 | අත්අඩංගුවට ගැනීමෙන් බේරාගැනීම සඳහා උදයංග වීරතුංග හට උදව් කිරීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩබ්ලිව්. තිලකරත්න මහතාට විරුද්ධව අහිම්සා වික්‍රමතුංග විසින් අල්ලස් හා දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වෙත පැමිණිලි කරන ලදි. |
| 2020 මාර්තු 02 | ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ ජනාධිපති ධුරයට පත්වීම හේතුවෙන් ඔහු ජනාධිපති ධුරයේ සිටින කාලය පුරා එක්සත් ජනපදයේ ඔහුට විරුද්ධව පවරා ඇති නඩුවලින් මුක්තියක් ලැබෙන බැවින් නවවන චක්‍රීය අභියාචනාධිකරණය විසින් අහිම්සා වික්‍රමතුංග ගේ ඉල්ලීම අගතියකින් තොරව නිෂ්ප්‍රභ කිරීමට අවසර ලබාදෙන ලදි.<br><br>මෙකී නව වන චක්‍රීය අධිකරණයේ තීන්දුව මගින් ගෝඨාභය රාජපක්ෂ රාජ්‍ය නායකයකු වශයෙන් වූ විනිර්මුක්තිය නොලැබීමෙන් අනතුරුව ඔහුට විරුද්ධව නඩු පැවරීම සඳහා මග සළසනු ලබයි. |
| 2020 ජුනි 18 | කර්තෘවරයෙකු හා මාධ්‍යවේදියකුව සිටි ලසන්ත වික්‍රමතුංගගේ දියණිය වන අහිම්සා වික්‍රමතුංග විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඒ.ආර්.පී.ජේ අල්විස් මහතාව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කිරීම අත්හිටුවන ලෙස ඉල්ලා පොලිස් කොමිසම වෙත අභියාචනය කරන ලදි.<br><br>ඒ සම්බන්ධව ප්‍රකාශයක් නිකුත් කරමින් අහිම්සා වික්‍රමතුංග කියා සිටියේ ඇගේ පියාගේ ඝාතනය සම්බන්ධයෙන් අල්විස් මහතා අත්අඩංගුවට ගැනීමට නියෝග කර ඇති බැවින් ඔහු එවන් උසස් තනතුරකට නුසුදුසු වන බවයි. |
| 2018 ජුනි 22 | ජාතික පොලිස් කොමිෂමේ නිර්දේශය පරිදි මෑතක දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඒ.ආර්. පී.ජේ අල්විස් මහතාගේ පත්කිරීම සම්බන්ධව වැඩබලන පොලිස්පතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිත ය. |
| 2020 ඔක්තෝම්බර් 28 | හිටපු හමුදා බුද්ධි නිලධාරියකු වන ප්‍රේම් ආනන්ද උදලගම විසින් දේශපාලන හිංසනය පිළිබඳ සිද්ධීන් විමර්ශනය කරනු ලබන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ සාක්ෂි දෙමින් ප්‍රකාශකර සිටියේ මාධ්‍යවේ දී ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ විමර්ශන දෙපාර්තමේන්තුව අධිකරණය නොමග යවා ඇති බවයි. |
| 2020 දෙසැම්බර් 04 | අභාවප්‍රාප්ත ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් ගොනු කරන ලද නඩුව ගල්කිස්ස මහේත්‍රාත්වරයා විසින් 2021 |

| | |
|---|---|
| | ජුනි 14 වන දිනට කල්තබන ලදි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එදින අධිකරණයේ පෙනී සිටිය ද නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජනයක් එදින නොතිබුණි. |
| 2021 ජනවාරි 08 | ලසන්ත වික්‍රමතුංගගේ දියණිය විසින් සිය පියා ඝාතනය කිරීම සම්බන්ධව වන නඩු විභාගය සඳහා සහාය පැතීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට පැමිණිල්ලක් ගොනු කරන ලදි. |

| 7. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම, 2010 | |
|---|---|
| 2019 මැයි 23 | බොදු බල සේනා සංවිධානයේ මහලේකම් ගලගොඩඅත්තේ ඥාණසාර හිමිහට ජනාධිපති සමාව ලබාදීම. |
| 2019 මැයි 25 | අතුරුදහන් වූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ විසින් බොදු බල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥාණසාර හිමි හට සමාව ජනාධිපති සමාව ලබාදීමෙන් අනතුරුව ඇයටත් ඇගේ දරුවන්ටත් ආරක්ෂාව ඉල්ලා අගමැති රනිල් වික්‍රමසිංහ වෙත ලිපියක් යොමු කරනු ලබයි. |
| 2019 ජුනි 24 | ජනාධිපති සමාව මත ගලගොඩඅත්තේ ඥාණසාර හිමි නිදහස් කිරීමට ගනු ලැබූ තීරණයට විරුද්ධව සන්ධ්‍යා එක්නැලිගොඩ විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකරන ලදි. |
| 2019 සැප්තැම්බර් 10 | ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් ගලගොඩඅත්තේ ඥාණසාර හිමිට ජනාධිපති සමාව ලබාදීමට ගත් තීරණයට එරෙහිව සන්ධ්‍යා එක්නැලිගොඩ හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙක විභාග කරන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලදි. |
| 2019 නොවැම්බර් 06 | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අනුරාධපුරයේ දී සිය මැතිවරණ ප්‍රචාරණ රැළියක් අමතමින් ඔහු එළඹෙන නොවැම්බර් 17 වන දින බලයට පත් වූ වහාම අත්අඩංගුවේ පසුවන බුද්ධි අංශ නිලධාරීන් සහ හමුදා නිලධාරීන් නිදහස් කරනු ලබන බවට සිදුකරන ලද ප්‍රකාශයට එරෙහිව අතුරුදහන් වූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති වෙත පැමිණිලි කරන ලදි. |
| 2019 නොවැම්බර් 27 | ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ජනවාරි 25 සිට 27 දක්වා කාලය තුළ 'පැහැරගෙන ගොස් ඝාතනය කිරීම' සම්බන්ධව කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් යුධ හමුදාවේ නවදෙනෙකට (09) විරුද්ධව අධිචෝදනා ගොනු කරන ලදි.<br><br>විත්තිකරු වෙත පූර්වයෙන් නියම කරන ලද ඇප කොන්දේසි (මහාධිකරණයේ පරීක්ෂණ අතරතුර) උල්ලංඝණය කර නොමැතිවීම නිසා පැමිණිල්ල විසින් විත්තිකරුට ඇප ලබාදීම සම්බන්ධයෙන් විරෝධය නොපෑම හේතුවෙන් විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් සැකකරුව පූර්ව ඇප කොන්දේසි මත නිදහස් කරන ලදි. කෙසේ වුව ද, අධිකරණය විසින් විත්තිකරු හට විදේශ ගමන් තහනමක් පැනවූ අතර විත්තිකරුගේ විදේශ ගමන් බලපත්‍රය අධිකරණයට භාරදෙන ලෙස ද නියෝග කරන ලදි. |

| | |
|---|---|
| 2019 නොවැම්බර් 18 | බුද්ධි අංශ නිලධාරීන් 09 දෙනෙකුට එරෙහිව ගොනු කර ඇති නඩුවේ සාක්ෂි විභාගය ආරම්භ කිරීමට විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය තීරණය කරන ලද අතර සාක්ෂිකරුවන්ට සිතාසි ද නිකුත් කරන ලදි. |
| 2019 දෙසැම්බර් 31 | අතුරුදහන් වූ කාටූන් ශිල්පී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ ප්‍රකාශ කරන ලද්දේ යුධ හමුදා බුද්ධි අංශ නිලධාරීන් විසින් නඩුවට සම්බන්ධ සාක්ෂිකරුවන්ව බිය ගන්වන ලදයි. තවද හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක සිය සැමියාගේ අතුරුදහන්වීම සම්බන්ධ බවට කරනු ලබන ප්‍රකාශ ද ඇය විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර අධිකරණ ක්‍රියාවලිය වෙත බලපෑම් නොකරන ලෙසට ඇය නව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටින ලදි. |
| 2020 ජනවාරි 20 | කොළඹ මහාධිකරණය විසින් ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගැනීම සම්බන්ධයෙන් වූ නඩුව පෙබරවාරි 06 වන දින දක්වා කල් තබන ලදි. |
| 2020 පෙබරවාරි 06 | පෙබරවාරි මස 13 වන දින මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ චෝදනාව සම්බන්ධව යුධ හමුදා නිලධාරීන් නවදෙනෙකුට (09) විරුද්ධව ගොනු කර ඇති නඩුව විභාගයට ගන්නා ලෙසට විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් නියෝග කරන ලදි. |
| 2020 පෙබරවාරි 13 | කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගැනීම සම්බන්ධයෙන් වූ නඩුව 2020 පෙබරවාරි 20 දින සිට විභාගයට ගැනීමට කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල විසින් තීරණය කරන ලදි. |
| 2020 පෙබරවාරි 20 | මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීම සම්බන්ධයෙන් ගොනු කර තිබෙන නඩුවේ සාක්ෂි විභාගය මාර්තු මස 11 වන දින කොළඹ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ ආරම්භ කිරීමට නියමිත ය. |
| 2020 මාර්තු 11 | මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩුවේ විත්තිකරුවන් ලෙස නම්කර ඇති සැකකරුවන් නවදෙනා විසින් අධිකරණය ඉදිරියේ ප්‍රකාශ කරන ලද්දේ ඔවුනට විරුද්ධව ගොනු කර ඇති චෝදනාවලට ඔවුන් වැරදිකරුවන් නොවන බවයි.<br><br>මෙම නඩුවේ පැමිණිල්ලේ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන ද සිල්වා ඉල්ලා සිටින ලද්දේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් දිලීප පීරිස් නිල රාජකාරි වලින් බැහැරව සිටීම නිසා ඔහුට අධිකරණයෙන් පෙනී සිටීමට නොහැකි වූ බැවින් මේ සම්බන්ධයෙන් වැඩිදුර නඩු විභාගය මාර්තු 16 දක්වා කල් තබන ලෙසට ඉල්ලා සිටින ලදි. තව ද මෙම නඩුවේ 4 වන සාක්ෂිකරු ලෙස නම්කර සිටින එල්. ටී. ටී. ඊ සංවිධානයේ හිටපු සාමාජිකයක වන සුරේෂ් කුමාර් හට වරෙන්තු නිකුත් කරන ලෙසට ද ඔහු අධිකරණයෙන් ඉල්ලීමක් කරන ලදි. කුමාර් නමැත්තා මේ වනවිට පැරිසියේ අත්අඩංගුවේ පසුවන බවත්, ඔහු පැරිසියෙන් පිටුවහල් කරනු ලැබුවහොත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේහි දී පොලීසියට ඔහුව අත්අඩංගුවට ගැනීමට හැකි වන ලෙසට වරෙන්තු නිකුත් කරන ලෙසත් ඔහු ඉල්ලා සිටියේ ය.<br><br>තව ද මෙම නඩුවේ පළමු සාක්ෂිකරු වන මියගිය මාධ්‍යවේ දී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ මහත්මියට ද මාර්තු 16 වන දින අධිකරණයේ පෙනී සිටින ලෙසට නොතීසි නිකත් කරන ලදි. |

| | |
|---|---|
| 2020 මාර්තු 13 | මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීම සම්බන්ධයෙන් යුධ හමුදා බුද්ධි අංශ නිලධාරීන් නව දෙනෙකුට එරෙහිව ගොනු කර ඇති නඩුවේ හිටපු එල්.ටී.ටී.ඊ සාමාජික සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් රවීන්ද්‍රන් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ මහාධිකරණය විසින් ඊයේ දින එනම් මාර්තු 12 වන දින වරෙන්තුවක් නිකුත් කරන ලදි.<br><br>නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටින ලද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන සිල්වා මහතා අධිකරණයට දන්වා සිටින ලද්දේ පැමිණිල්ලේ සාක්ෂිකරු සුරේෂ් කුමාර් නීතිවිරෝධී ලෙස ප්‍රංශයේ රැඳී සිටින බවත් ඔහු ආපසු ගෙන්වාගැනීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවයි. |
| 2020 ජූලි 15 | මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් බලහත්කාරයෙන් අතුරුදන් කිරීමේ නඩුවේ විත්තිකරුවන් දෙදෙනෙකු විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදි. මෙකී මූලික අයිතිවාසිකම් නඩුව හමුදා බුද්ධි අංශ සාමාජික ලුතිනන් කර්නල් එරන්ත පීරිස් සහ කොප්‍රල් එස්. කේ. උලුගෙදර විසින් ගොනු කරන ලද අතර ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙනෙ ගොස් ඝාතනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී බව එකී පෙත්සම මඟින් කියා සිටින ලදි.<br><br>මෙම පෙත්සම පිළිබඳව මූලික විරෝධතා මතු කරමින් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා කියා සිටින ලදුයේ විත්තිකරුවන් දෙදෙනාට එරෙහි චෝදනා ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි පවතින බවයි. තවද දුරකථන වාර්තා සහ වෙනත් සාක්ෂි පිළිබඳව වූ විශ්ලේෂණ වාර්තා පදනම් කරගනිමින් මොවුන් දෙදෙනාට එරෙහිව චෝදනා ගොනු කරන ලද බව ඔහු වැඩිදුරටත් පැවසීය. මෙකී ඉදිරිපත් කිරීම් සළකා ගනිමින් එරන්ත පීරිස් සහ එස්.කේ උළුගෙදර විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම ප්‍රතික්ෂේප කරන ලදි. |
| 2020 අගෝස්තු 25 | දේශපාලන හිංසන පිළිබඳව සිද්ධීන් විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුවේ හිටපු අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස් යන අය වෙත සැප්තැම්බර් 10 වන දින දේශපාලන හිංසන පිළිබඳව සිද්ධීන් විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට නොතීසි නිකුත් කරන ලදි.<br><br>කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන මහතා විසින් කොමිසම වෙත සිදුකරන ලද පැමිණිල්ලක් මත ඔවුන් වෙත එසේ නිකුත් කර ඇත. හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභාය රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සිදුකරන ලදැයි ප්‍රකාශ කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහුට බලපෑම් කරන ලද බවට වූ එකී පැමිණිල්ල කොමිෂන් සභාවේ අවධානයට ලක්කරමින් ඔවුනට නොතීසි නිකුත් කරන ලදි. |
| 2020 ඔක්තෝම්බර් 19 | බොදුබලසේනා මහලේකම් පූජ්‍ය ගලබොඩඅත්තේ ඥාණසාර ස්වාමින්වහන්සේට ජනාධිපති සමාව දීමට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ගත් තීරණය අභියෝගයට ලක්කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ගොනු කරන ලද අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා දින නියම කරන ලදි. |

| 8. වසීම් තාජුඩීන් ඝාතනය, 2012 | |
|---|---|
| 2012 මැයි 17 | රග්බි ක්‍රීඩක වසීම් තාජුඩීන්ගේ සිරුර කොළඹ 05 උද්‍යාන පාරේ ශාලිකා ශාලාව අසළ දී පිළිස්සෙමින් තිබූ ඔහුගේ මෝටර් රථයේ තිබිය දී සොයාගන්නා ලදි. |
| අප්‍රේල් 2013 | මෙකී මරණයට හේතු වශයෙන් අධිකරණ වෛද්‍ය මහාචාර්ය ආනන්ද සමරසේකර ඔහුගේ අතුරු වාර්තාවේ සඳහන් කර තිබෙනුයේ මොට ආයුධයකින් හිසට පහරදීම සහ කාබන් මොනොක්සයිඩ් විෂවීම සහ පිළිස්සීම හේතුවෙන් ඔහුගේ මරණය සිදුව ඇති බවයි. |
| ජුලි 2013 | පොලීසිය විසින් මෙම සිද්ධිය රථවාහන අනතුරක් වශයෙන් තීන්දුකරන ලදි. |
| මාර්තු 2015 | අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විමර්ශන භාරගන්නා ලදි. |
| 2015 ජුලි 27 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ දී රහස් පොලීසිය සඳහන් කරන ලද්දේ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාවල සහ පශ්චාත් මරණ පරීක්ෂණයේ විෂමතාවයන් පවතින බැවින් වගකිවයුතු නිලධාරීන්ගෙන් ප්‍රශ්න කරන බවයි. ඒ අනුව තාජුඩීන්ගේ මරණය දරුණු අපරාධය ක්‍රියාවක්වන්ට ඇති බවට වූ තොරතුරු අනාවරණය වී තිබේ. වැඩිදුර පරීක්ෂණ පැවැත්වීම සඳහා මෘත ශරීරය නැවත ගොඩගන්නා ලෙසට ද රහස් පොලීසිය විසින් ඉල්ලීමක් ද කරන ලදි. |
| අගෝස්තු 06 2015 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ඉල්ලීමට අනුව අගෝස්තු 06 වන දින ජාතික රග්බි ක්‍රීඩක වසීම් තාජුඩීන්ගේ දේහය අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා, ආගමික පූජකවරුන් සහ ග්‍රාම නිලධාරීයා ඉදිරියේ ගොඩගත යුතු බවත් මෘත ශරීරයට පොලිස් ආරක්ෂාව සැපයිය යුතු බවටත් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් නිශාන්ත පීරිස් නියෝග කරන ලදි.<br><br>තාජුඩීන් ඝාතනයට ටික වේලාවකට පෙර ඔහු පැහැරගැනීම සඳහා ලෑන්ඩ් රෝවර් වර්ගයේ ඩිෆෙන්ඩර් රථයක් භාවිත කර ඇති අතර එය ශිරන්ති රාජපක්ෂ මහත්මියගේ සිරිලිය සවිය පදනම සතු වූ වාහනයක් බවත් සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත. |
| අගෝස්තු 10 2015 | වසීම් තාජුඩීන්ගේ දේහය ගොඩගන්නා ලද අතර අධිකරණ වෛද්‍ය විශේෂඥයින් තිදෙනෙකු විසින් නව පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකරණ ලදි. |
| සැප්තැම්බර් 2015 | මෙම වාර්තාව උරස් අස්ථිය, ශ්වාසනාලය, හා සමමිතික අස්ථි බිඳීම් සහිත දිගු අස්ථි දෙකක් ඝාතනයට ලක් වූ අනුව ඝාතනයට ලක් වූ රග්බි ක්‍රීඩක වසීම් තාජුඩීන්ගේ දේහයෙන් අතුරුදන්ව ඇති බවයි. තාජුඩීන්ගේ මරණයට හේතුව ඔහුගේ කකුල්වලට, බෙල්ලට හා පපුවට මොට ආයුධ මගින් සිදු වූ බහුවිධ තුවාලවල ප්‍රතිවිපාක හා අනතුරුව වූ ගින්නෙන් ප්‍රතිඵලයක් බවත් නිගමය විය. වාර්තාව තවදුරටත් පෙන්වාදෙනුයේ 'මේ කරුණු සියල්ල සළකා බලා මියගිය පුද්ගලයා මෙම වාහන අනතුර සිදුවන අවස්ථාවේ දී රිය පදවා නොමැති බවත්, මියගිය පුද්ගලයාට පහරදී සිරුර අශක්නුකෘත වීමෙන් පසු සිරුර අනතුර සිදුවන අවස්ථාවේ දී හෝ ඊට පෙර මගී අසුනේ තබා අනතු සිදුවීමට ඉඩ සළස්වා ඇති බව අපගේ මතයයි' යනුවෙන් සඳහන් කර ඇත. |
| නොවැම්බර් 03 2015 | තාජුඩීන් ඝාතනය පිළිබඳව නඩුව විසඳීම සඳහා කඩිනම් පියවර ගනිමින් සිටි මහේස්ත්‍රාත් නිශාන්ත පීරිස් මහත්මා, 2016 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධිකරණ සේවා කොමිසන් සභාව විසින් මාතර දිසා අධිකරණය වෙත මාරුකරනු ලැබීය. |

| | |
|---|---|
| දෙසැම්බර් 2015 | පසුව සී.සී.ටී.වී දර්ශන විශ්ලේෂණය කිරීමෙන් පසුව රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන් ඝාතනයට සම්බන්ධ පුද්ගලයින් තිදෙනෙකු හඳුනාගෙන තිබේ. මේ අතර නාවික හමුදාවට සම්බන්ධ පුද්ගලයින් ද දෙදෙනෙකු වේ. |
| දෙසැම්බර් 30 2015 | අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මහේස්ත්‍රාත් නිශාන්ත පීරිස් මහතාගේ ස්ථාන මාරුව අවලංගු කරන ලදි. |
| ජනවාරි 05 2016 | වසීම් තාජුඩීන් ඝාතනයට අදාළ සී.සී.ටී.වී දර්ශන විශ්ලේෂණය කරන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ පරිඝණක විශේෂඥයින් නිර්දේශ කරන ලද්දේ එකී දර්ශනයන් ඇමරිකා එක්සත් ජනපදයේ එෆ්.බී.අයි රසායනාගාර සේවය, කැනඩාවේ බ්‍රිටිෂ් කොළොම්බියා රසායනාගාර සේවය හෝ එංගලන්තයේ මෙට්‍රොපොලිටන් පොලිස් සේවය වැනි අධිකරණ වෛද්‍ය රසායනාගාරයක් වෙත විශේෂඥ අධිකරණ වෛද්‍ය රසායනාගාරයක් වෙත යැවිය යුතු බවට නිර්දේශ කරන ලදි. |
| පෙබරවාරි 25 2016 | මහේස්ත්‍රාත්වරයා විසින් වසීම් තාජුඩීන්ගේ මරණය මිනීමැරුමක් බවට තීන්දු කරන ලදි. |
| මාර්තු 03 2016 | කොළඹ අතිරේක මහේස්ත්‍රාත් නිශාන්ත පීරිස් විසින්, කොළඹ 05, උද්‍යාන පාරේ පිහිටි කාර්යාලයේ 2012 මැයි 16 වන සී.සී.ටී.වී කැමරාවල සටහන්ව ඇති වාර්තා ගබඩාකරන ලද දෘඪ තැටි අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසට ඊ.පී.ඩී.පී. නායක හිටපු අමාත්‍ය ඩග්ලස් දේවානන්ද වෙත නියෝග කරන ලදි. |
| අප්‍රේල් - මැයි 2016 | බස්නාහිර පළාතේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක සහ නාරාහේන්පිට පොලිසියේ අපරාධ අංශයේ හිටපු ස්ථානාධිපති සුමිත් චම්පික යන අය සාක්ෂි වසන් කිරීම යන චෝදනාව යටතේ අත්අඩංගුවට ගන්නා ලදි.<br><br>හිටපු රග්බි ක්‍රීඩක වසීම් තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය සිදු නොකරන ලෙසට ඉහළපෙළේ පොලිස් නිලධාරීන්ගේ උපදෙස් ලැබී ඇති නාරාහේන්පිට පොලීසියේ අපරාධ අංශයේ හිටපු ස්ථානාධිපති සුමිත් චම්පික පෙරේරා මහතා අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ය. |
| මැයි 13 2016 | ඝාතනය කරන ලද වසීම් තාජුඩීන්ගේ පළමු මරණ පරීක්ෂණය පැවැත් වූ හිටපු කොළඹ හිටපු ප්‍රධාන අධිකරණ වෛද්‍ය ආනන්ද සමරසේකරගේ නායකත්වයෙන් යුත් අධිකරණ වෛද්‍ය කමිටුව වෙතට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර විනය කමිටුවක් විසින් මේ පිළිබඳව විමර්ශනය කරන බව වෛද්‍ය සභාව විසින් අධිකරණයට දන්වා සිටින ලදි. |
| සැප්තැම්බර් 20 2016 | වසීම් තාජුඩීන්ගේ සිරුර, අධිකරණ වෛද්‍ය ආනන්ද සමරසේකර විසින් මාලබේ පිහිටි පෞද්ගලික ආයතනයකට මාරුකර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක රවීන්ද්‍ර විමලසිරි විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දෙන ලදි. |
| නොවැම්බර් 02 2016 | තාජුඩීන් ඝාතනය සිදු වූ රාත්‍රියේ දී නාරාහේන්පිට පොලීසියේ හිටපු ස්ථානාධිපති ඩේමියන් පෙරේරා හට ලැබී තිබෙන දුරකථන ඇමතුම් සම්බන්ධව පුළුල් පරීක්ෂණයක් ආරම්භ කර තිබෙන බව, හිටපු රග්බි ක්‍රීඩක වසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට දැනුම් දෙන ලදි. ශාලිකා ක්‍රීඩාංගණය අසළ දී තාජුඩීන්ගේ මරණය සිදු වූ දිනයේ දී නාරාහේන්පිට හිටපු ස්ථානාධිපති ඩේමියන් පෙරේරා හට ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් දුරකථන අංක මගින් දුරකථන ඇමතුම් තුනක් ලැබී ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් නිශාන්ත පිරිස් වෙත මීට පෙර අවස්ථාවක දී ද දැනුම් දෙන ලදි. |

| | |
|---|---|
| ජුනි 02 2017 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක ඇප මත නිදහස් විය. |
| සැප්තැම්බර් 28 2017 | ජනාධිපති ලේකම් කාර්යාලයේ සිට නාරාහේන්පිට පොලීසියේ හිටපු ස්ථානාධිපතිවරයා හට විවිධ ඇමතුම් ලැබුණු බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නාය මහතා විසින් මහේස්ත්‍රාත් ජෙයරාම් ට්‍රොස්කි වෙත දැනුම්දෙන ලදි. |
| ඔක්තෝම්බර් 02 2017 | හිටපු අධිකරණ වෛද්‍යවරයා මෙම විමර්ශනයේ තුන්වන සැකකරු ලෙස නම්කරන ලදි. |
| ඔක්තෝබර් 19 2017 | වසීම් තාජුඩීන්ගේ මරණය පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ව්‍යාජ ලෙස සකස් කර ඇති බවත් එම නඩුවේ සාක්ෂි විනාශ කළ බවත් කියන චෝදනාව මත ඔහුව අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇතැයි යන අපේක්ෂාවෙන් කොළඹ හිටපු ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී ආනන්ද සමරසේකර මහතා අධිකරණයට භාරවිය.<br><br>ඔහු විසින් ඇප ඉල්ලීමක් ගොනු කර තිබූ අතර, ඔහුගේ අසනීප තත්ත්වය සහ ඔහුට ලබාගනු ලබන ප්‍රතිකාර සැළකිල්ලට ගනිමින් ඔහුට ඇප මත මුදාහරින ලදි. |
| ජනවාරි 26 2018 | මෙම සිද්ධිය සිදු වූ වහාම ජනාධිපති ලේකම් කාර්යාලය සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක අතර දුරකථන ඇමතුම් කිහිපයක් සිදු වී ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ වලින් හෙළිවිය. රග්බි ක්‍රීඩක වසීම් තාජඩීන් ගේ ඝාතනය සම්බන්ධයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පවුලේ සමීපතමයන් කිහිපදෙනෙකුගෙන් ප්‍රකාශ කිහියක් ලබාගැනීම අවශ්‍ය බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නායක මහතා කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධර්ශිකා විමලසිරි මහත්මිය වෙතත දැනුම් දෙන ලදි. රාජපක්ෂ පවුලේ සාමාජිකයකු ජනාධිපති ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන දෙකක් යොදාගනිමින් අපරාධ ස්ථානය ආසන්නව ගමන්කර ඇති බව අනාවරණය වී තිබෙන බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් අධිකරණය හමුවේ ප්‍රකාශ කරන ලදි. තවද එකී වාහන දෙක නාවික හමුදාවේ සාමාජිකයන් දෙදෙනෙක් විසින් ධාවනය කර ඇති බවත්, එම නාවික හමුදා නිලධාරීන් දෙදෙනාගෙන් ප්‍රකාශ ලබාගැනීම සඳහා පියවර ගන්නා බව ද සඳහන් කරන ලදි. |
| ජුනි 2018 | හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පවුලේ අංශය වෙත අනුයුක්ත කර ඇති නාවික හමුදා නිලධාරීන් පිළිබඳ වාර්තා නොමැති බව නාවික හමුදාව විසින් රහස් පොලීසිය වෙත දැනුම් දෙන ලදි. |
| සැප්තැම්බර් 20 2018 | ශ්‍රී ලංකා රතුකුරුස සංගමය විසින් සිරිලිය සවිය පදනම වෙත ලබාදෙන ලද ඩිෆෙන්ඩර් වර්ගයේ රථයක් තාජුඩීන් පැහැරගැනීම සඳහා යොදාගන්නා ලද බවට විශ්වාසදායක සාක්ෂි තිබෙන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ඉසුරු නෙත්තිකුමාර මහතා හට දැනුම්දෙන ලදි. |
| ඔක්තෝබර් 2018 | වින්දිතයා පැහැරගෙන ගොස් ඝාතනය කිරීම සඳහා භාවිත කරන ලද ඩිෆෙන්ඩර් රථයේ කිසියම් ශරීර කොටසක් හෝ පුපුරණ ද්‍රව්‍ය තිබේදැයි සොයාබලන ලෙසට මහේස්ත්‍රාත්වරයා විසින් රජයේ රසපරීක්ෂකවරයා වෙත නියෝග කරන ලදි. |
| නොවැම්බර් 29 2018 | අපරාධයට සෘජුවම සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගන්නා ලෙස කොළඹ අතිරේක මහේස්ත්‍රාත්වරයා විසින් රහස් පොලීසියට උපදෙස් දෙන ලදි. |
| පෙබරවාරි 28 2019 | නාරාහේන්පිට පොලීසියේ හිටපු ස්ථානාධිපති සුමිත් පෙරේරා, හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක සහ කොළඹ හිටපු අධිකරණ වෛද්‍ය ආනන්ද සමරසේකර යන සැකකරුවන් තිදෙනාට එරෙහිව අධිචෝදනා ගොනු කරන බව නීතිපතිවරයා විසින් අධිකරණයට දැනුම්දෙන ලදි.<br><br>හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක ඒකකයේ සේවය කරන |

| | |
|---|---|
| | ලද යුධ හමුදා සහ නාවික හමුදා නිලධාරීන් කිහිපදෙනෙකු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙන බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. කෙසේ වුවද ඔවුන්ගේ නිල වාර්තා සොයාගැනීමට ගත් උත්සාහයන් අසාර්ථක විය.<br><br>ලැප්ටොප් පරිඝණකයක් සහ තාජුඩීන් භාවිත කරන ලද ජංගම දුරකථනය පිළිබඳ සිදුකරන ලද පරීක්ෂණ මඟින් දැනට සිදුකරගෙන යනු ලබන විමර්ශන සඳහා ප්‍රයෝජනවත් තොරතුරු අනාවරණයක් සිදුකර ගැනීමට අපොහොසත් වී ඇතිබව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් අධිකරණයට දන්වන ලදි.<br><br>මහේස්ත්‍රාත්වරයා විවෘත අධිකරණයේ ප්‍රකාශයක් කරමින් කියා සිටියේ මෙකී විමර්ශනයට අදාළව සිදුකරනු ලබන සාක්ෂි අනාවරණය කරගැනීම සම්බන්ධයෙන් ප්‍රගතියක් දක්නට නොලැබෙන බවයි. එබැවින් නඩු විභාගය සිදුකිරීම කඩිනම් කිරීමටත් නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව සාක්ෂි තිබේනම් අධිචෝදනා ගොනුකරන ලෙසත් ය. |
| මැයි 24 2019 | හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායකට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 198 වන වගන්තිය යටතේ වසීම් තාජුඩීන් ඝාතන නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග හා දඬුවම්වලින් ආරක්ෂා කිරීම සඳහා අසත්‍ය තොරතුරු සැපයීම යන චෝදනාව යටතේ නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණයේ අධිචෝදනා ගොනු කරන ලදි. ඒ අනුව කොළඹ මහාධිකරණය විසින් වසීම් තාජුඩීන් ඝාතන නඩුවේ වැරදිකරුවන් හට නීතිමය දඬුවම් ලබාදීමෙන් ආවරණය කිරීම සම්බන්ධයෙන් හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායකට විරුද්ධව නොතීසි නිකුත් කරන ලදි. |
| ජුනි 27 2019 | කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ශලනි පෙරේරා විසින් වසීම් තාජුඩීන් ඝාතනයේ පළමුවන විත්තිකරුවන නාරාහේන්පිට පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපතිව සිටි සුමිත් පෙරේරා නිදහස් කරන ලදි. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායකට විරුද්ධව නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයක් ගොනු කළ අතර 2012 සිදු වූ මෙම ඝාතනය සම්බන්ධව නඩු විභාගයකට මුහුණ දුන් පළමු චෝදනා ලත් පුද්ගලයා බවට ඔහු පත්වනු ඇත. 2015 වසරේ මෙම නඩුව නැවත විභාගයට ගැනීම සිදුකරන තෙක් රග්බි ක්‍රීඩකයාගේ ඝාතනය මෝටර් රථ අනතුරක් ලෙස තීන්දු කිරීමෙන් ඝාතනය වසන් කිරීමට උත්සාහ ගැනීම හේතුවෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 198 වන වගන්තිය යටතේ ඔහුට විරුද්ධව කොළඹ මහාධිකරණයේ අධිචෝචනා නගා ඇත. |
| ජූලි 30 2019 | හැව්ලොක් ක්‍රීඩා සමාජයේ හිටපු නායක වසීම් තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධ සාක්ෂි වසන් කිරීමේ චෝදනාව සම්බන්ධව හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායකට විරුද්ධව වන නඩුව ඔක්තොම්බර් මස 23 වන දින විභාගයට ගැනීමට කොළඹ මහාධිකරණය දින නියම කරන ලදි. |
| අගෝස්තු 07 2019 | හිටපු අධිකරණ වෛද්‍ය නිලධාරී ආනන්ද සමරසේකර මහතාට නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණයේ දී අධිචෝදනා ගොනු කරන ලදි. |
| 27 අගෝස්තු 2019 | මහාචාර්ය ආනන්ද සමරසේකර මහතාට විරුද්ධව අධිචෝදනා ගොනුකර ඇප මත මුදාහරින ලදි. |
| ජනවාරි 16 2020 | රග්බි ක්‍රීඩක වාසිම් තාජුඩීන් ඝාතනය පිළිබඳ සාක්ෂි සැඟවීම සම්බන්ධයෙන් චෝදනා ලත් බස්නාහිර පළාතතේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක සම්බන්ධයෙන් මාර්තු 02 වන දින කරුණු ඉදිරිපත් කරන ලෙස කොළඹ මහාධිකරණ විනිසුරු විකුම් කළුආරච්චි මහතා නියෝග කරන ලදි. |
| පෙබරවාරි 24 2020 | ජාතික තලයේ රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන් ඝාතනයට අදාළ සාක්ෂි වසන් කිරීම සම්බන්ධයෙන් කෙළඹ හිටපු අධිකරණ වෛද්‍ය නිලධාරී මහාචාර්ය ආනන්ද සමරසේකරට එරෙහිව වූ නඩු විභාගය ජුනි මස 11 වන දින විභාගයට ගැනීම |

| | |
|---|---|
| | සඳහා නැවත දින නියම කරන ලදි. |
| ජූලි 22<br>2020 | තාජුඩීන් ඝාතනයේ 3 වන සැකකරු වූ අධිකරණ වෛද්‍ය මහාචාර්ය ආනන්ද සමරසේකර මියගොස් ඇති බව නීතිපතිවරයා විසින් වැඩබලන මහේස්ත්‍රාත්වරයා වෙත දන්වන ලදි. |
| සැප්තැම්බර්<br>26<br>2020 | කොළඹ මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් තිබූ මෙම නඩුවේ සැකකරු මියගිය බැවින් මෙම නඩුවේ වැඩිදුර විමර්ශන අවසන් කරන ලදි.<br><br>කොළඹ හිටපු අධිකරණ වෛද්‍යවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සළකා බැලීමෙන් අනතුරුව මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මහතා කියා සිටයේ මහාචාර්ය ආනන්ද සමරසේකර මහතා මියගොස් ඇති බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් විනිසුරුවරයා නඩුවේ වැඩිදුර කටයුතු අවසාන කරන ලදි. |
| ඔක්තෝම්බර්<br>06<br>2020 | නාරාහේන්පිට පොලිස් ස්ථානයේ හිටපු ස්ථාන භාර පොලිස් නිලධාරී සුමිත් පෙරේරා පෙන්වාදෙන ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර ඔහුට තර්ජනය කරන ලද බවත් සෙසු නිලධාරීන් විසින් රග්බි ක්‍රීඩක තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් එකී ඝාතනය සම්බන්ධ විමර්ශන යටගසන ලෙසට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ යන දෙදෙනා ඔහු වෙත බලකරන ලද බවට පවසන ලෙස තර්ජනය කරන ලද බවත් ඔහු කියා සිටින ලදි.<br><br>ඊයේ දින(05) ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් කියා සිටියේ ඔහු නාරාහේන්පිට පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා බවත් තාජුඩීන් ගේ මරණය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලද බවත් පෙන්වාදෙන ලදි. මූලික විමර්ශන සහ අධිකරණයේ ඉදිරිපත් කළ සාක්ෂි වලින් අනතුරුව මහේස්ත්‍රාත්වරයා විසින් තාජුඩීන්ගේ ඝාතනය බීමතින් රිය පැදවීමෙන් බවත් වාහන අනතුරකට ලක්ව ගිනිගෙන ඇති බව පෙන්වා දෙන ලදි. කෙසේ වෙතත් යහපාලන රජය පත්කිරීමෙන් පසුව, මෙම නඩුව මිනීමරුමක් ලෙස තීන්දු කිරීමෙන් අනතුරුව ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබීය. |

| 9. වැලිකඩ බන්ධනාගාර සිද්ධිය, 2012 | |
|---|---|
| නොවැම්බර් 09<br>2012 | වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් පිරිසක් මැඩපැවැත්වීම සඳහා යුධ හමුදාව සහ විශේෂ කාර්යය සාධක බලකාය යොදවා තිබුණු අතර රජය පෙන්වාදෙන ලද්දේ එකී සිරකරුවන් ත්‍රස්තවාදී සැකකරුවන් බවයි. මෙකී ප්‍රහාරයෙන් සිරකරුවන් 27 දෙනෙකු මියගොස් 43 දෙනෙකු තුවාල ලබා තිබේ. ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ වාර්තාවල අනුව, සිද්ධිය වූ විගස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා බන්ධනාගාරය තුළ සිටිනු දැක ඇති අතර, එම නිසා සමූල ඝාතනය අතරතුර හමුදා නිලධාරීන් බන්ධනාගාරය තුළ සිටින බව ඔහු දන්නා බව විශ්වාස කළ හැකි ය. දැනට පවතින මරණ සහතික දෙකකට අනුව වෙඩි තැබීම නිසා එකී මරණ සිදුව ඇති බවයි.<br><br>කෙසේ වෙතත් එක් අයකු පෙන්වාදෙන ලද්දේ, වෙඩි තැබීම දු සිට සිදු වූ බවත් ඒ අතරේ ඇසින් දුටු සාක්ෂිකරුවන් තහවුරු කරන ලද්දේ වින්දිතයන් සියල්ලන්ටම වෙඩි තබා ඇති බවයි. |

| | |
|---|---|
| 2012 - 2015 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුවේ අවිනිශ්චත ය. 2015 දී එවකට රැඳවියකු ලෙස ඇසින් දුටු සාක්ෂිකරුවකුගේ වන සුදේශ් නන්දිමාල් පවසා සිටියේ විමර්ශන නිලධාරීන් විසින් එක් අවස්ථාවක දී ඔහුගේ ප්‍රකාශය ප්‍රමාණවත් යැයි පවසා ඔවුන් විසින් ඔහුගේ සම්පූර්ණ ප්‍රකාශය නොගත් බවයි.<br><br>එවක පුනරුත්ථාපන හා බනධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය චන්ද්‍රසිරි ගජධීර විසින් කොමිසමක් පත්කරන ලද නමුත් එකී අතුරු වාර්තාව හෝ අවසාන වාර්තාව ප්‍රසිද්ධ කර නොමැත. ත්‍රිපුද්ගල කමිටුව නිගමනය කර ඇත්තේ මෙම මරණ සිදුකර ඇත්තේ සෙසු රැඳවියන් විසින් බවත්, තත්ත්වය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකාය සහ හමුදාව කැඳවීම සාධාරණීකරණය කළ හැකි බවත් ය. එක් කොමසාරිස්වරයකු අනෙක් සාමාජිකයන් දෙදෙනා විසින් කරන ලද ඇතැම් නිර්දේශයන්ට එකඟ නොවූ බැවින් මෙම වාර්තාවේ නිර්දේශ කළ නොහැකි බව අමාත්‍යවරයා සඳහන් කරන ලදි.<br><br>එවකට බන්ධනාගාර කොමසාරිස් පී. ඩබ්ලිව් කොඩිප්පිලි විසින් තවත් කොමිසමක් පත්කරන ලද අතර තවමත් එකී වාර්තාව ප්‍රසිද්ධ කර නැත.<br><br>ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශන සිදුකරන ලදි. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම මත මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය අත්හිටුවා ඇති බව මානව හිමිකම් කවුන්සිලයේ සභාපතිවරයා විසින් මාධ්‍යයට ප්‍රකාශ කරන ලදි. |
| 2014 | ඝාතනයට ලක් වූ රැඳවියන්ගෙන් එක් අයකු වන විජය රොහාන නොහොත් 'ගුන්ඩු' ගේ මව වන ශ්‍රියාවතී සහ ඇගේ ලේලිය වන සමන්ති යන දෙදෙනා බොරු චෝදනා මත අත්අඩංගුවට ගනු ලැබීය. |
| 2015 | මෙම සිද්ධිය 2015 වර්ෂය ආරම්භයේ දී අධිකරණ අමාත්‍යවරයා විසින් පත්කරන ලද බන්ධනාගාර සිද්ධිය පිලිබඳ විමර්ශන කමිටුව විසින් විමර්ශනයට භාජනය කරන ලද අතර එකී කමිටුව විසින් සිය වාර්තාව 2015 ජුනි මස සිය වාර්තාව ඉදිරිපත් කරන ලදි. වාර්තාවේ නිර්දේශයන් ප්‍රසිද්ධියට පත් කළ නමුත් වාර්තාවේ අන්තර්ගතය ප්‍රකාශයට පත් නොකරන ලද අතර එම සිද්ධිය සම්බන්ධයෙන් දැනට සිදුකරගෙන යමින් පවතින නව පරීක්ෂණ සඳහා බාධාවක් වනු ඇති බවට එවකට අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලදි. මෙම කමිටුව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් ඇතුළුව රැඳවියන්, බන්ධනාගාර නිලධාරීන්, හමුදා නිලධාරීන් සහ පොලිස් විශේෂ බලකා නිලධාරීන්ගෙන් සාක්ෂි සටහන් කරගන්නා ලද අතර පසුව හමුදා බුද්ධි අංශ ප්‍රධානී කපිල හෙන්දාවිතාරණ, රාජ්‍ය බුද්ධි අංශයේ සහ ත්‍රස්ත විමර්ෂණ අංශයෙහි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා සහ චන්ද්‍රා වාකිෂ්ඨ සහ හිටපු බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුර සේනානායක මහතාගෙන් ද සාක්ෂි සටහන් කරගෙන ඇත.<br><br>පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පිළිබඳ හිටපු ලේකම් ආරියසිරි දිසානායක මහතා කමිටුව ඉදිරියේ කළ ප්‍රකාශයේ දී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ බලපෑම් හේතුවෙන් මෙම වැටලීම සිදුකර ඇති බව තහවුරු විය. සාක්ෂි සැපයීමේ දී එවකට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් පී. ඩබ්ලිව්. කොඩිප්පිලි පවසා ඇත්තේ 2012 ජූලි මස 17 වන දින පැවති රැස්වීමකදී පොලිස් විශේෂ කාර්යය බලකා නිලධාරීන් 798 දෙනෙකු යොදාගනිමින් වැටලීමක් සිදුකිරීමේ අවශ්‍යතාවය සාකච්ඡා කරන ලද බවත් ඊට ගෝඨාභය රාජපක්ෂ මහතා ද සහභාගී වූ බවයි.<br><br>පොලිස් විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරී - විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති |

| | |
|---|---|
| | චන්ද්‍රසිරි රණවන මහතා පෙන්වා දෙන ලද්දේ 2012.11.09 වන දින සිදුකරන ලද සෝදිසි මෙහෙයුම ස්වකැමැත්තෙන් කරන ලද්දක් නොව සාකච්ඡා මාලාවකින් අනතුරුව ගෝඨාභය රාජපක්ෂගේ මගපෙන්වීම මත 2012 වර්ෂයේ දී රාජ්‍ය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිමල් වාකිෂ්ඨ, රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ සහ ත්‍රස්ත්‍ර විමර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ සම්බන්ධීකරණයෙන් එය සිදු වූ බවයි. මෙම සිද්ධිය සිදුවන අවස්ථාව වනවිට පොලිස් විශේෂ කාර්ය බලකාය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ බවද රණවන මහතා පෙන්වාදෙන ලදි. |
| ජුනි 2015 | මෙම වාර්තාව මඟින් වධහිංසාව වරද යටතේ වන කරුණු සහ දණ්ඩ නීති සංග්‍රහයේ 162 වන වගන්තිය යටතේ වධහිංසා පැමිණවීම යටතට ගැනෙන උල්ලංඝණයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු නොකරන ලද කරුණු සැළකිල්ලට ගනිමින් නව අපරාධ විමර්ශයක් සිදුකිරීමට නිර්දේශ කර ඇත. ඒ අනුව පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ විශේෂ කණ්ඩායමක් විසින් පරීක්ෂණ පැවැත්වීමට නිර්දේශ කරන ලදි. |
| පෙබරවාරි 2016 | පිළිකා රෝගයකින් පෙළුණු සිරියාවතී මහත්මිය අත්අඩංගුවේ සිටියදී මියගියාය. ඇය වෙනුවෙන් ඇප ලබාගැනීම සඳහා ඇගේ ස්වාමියා වන අල්විස් විසින් නැවත නැවතත් සිදුකරන ලද උත්සාහයන් අසාර්ථක විය. මෙම අසාධාරණ ක්‍රියාකලාපයට එරෙහිව අල්විස් මහත්මා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂමෙන් නීතිමය ක්‍රියාමාර්ග ඉල්ලා සිටින ලදි. වසර දෙකක කාලයක් පැවති **එච්.ආර්.සී/2926/14** **(HRC/2926/14)** නඩුවේ කටයුතු අවසාන වූයේ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ය. මානව හිමිකම් කවුන්සිලය විසින් ඒ පිළිබඳව විමසූ විට පෙන්වා දුන්නේ ඔවුන්ගේ නිර්දේශ දැනටමත් අදාළ බලධාරීන් වෙත යවා ඇති අතර දැන් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඔවුන්ගේ කාර්යයක් නොවන බවයි. |
| 19 මාර්තු 2016 | සිද්ධිය වූ අවස්ථාවේ සිටි රැඳවියකු වූ සුදේශ් නන්දිමාල් සිල්වා විසින් පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ සිද්ධිය පිළිබඳ විමර්ශනය කරන ලද බන්ධනාගාර විමර්ශන කමිටුව වෙත වාර්තා කරන ලද්දේ ඔහු පසුපසින් නාඳුනන පුද්ගලයන් ලුහුබඳින බවයි. එවැනි එක් වාහනයක් - කළු පැහැති ජීප් රථයක් (අංක 62-0761 අංක තහඩු සහිත පැජරෝ වර්ගයේ රථය) පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට අයත් බව සොයාගන්නා ලදි. ඔහු ඒ පිළිබඳව මාලිගාවත්ත පොලීසියට (CIB I 148/146 යටතේ) පැමිණිලි කර ඇත. |
| ජනවාරි 2017 | මාධ්‍යවේදී කසුන් පුස්සේවෙල මහතා විසින් මානව හිමිකම් කවුන්සිලයේ පෙත්සමක් ගොනු කළ පසුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත.<br><br>එමෙන්ම තමන් වෙත එල්ල වී ඇති තර්ජන සම්බන්ධයෙන්, අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින් නිට්ටඹුව පොලීසිය වෙත පැමිණිල්ලක් සිදුකරන ලදි. |
| අප්‍රේල් 2017 | සාක්ෂිකරුවකු විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අයඳුම්පතක් මඟින් සිද්ධිය විමර්ශනය කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පොලීසිය වෙත බලකරන ලෙසට මැන්ඩාමුස් රිට් ආඥාවක් ඉල්ලා සිටින ලදි. |
| 17 ඔක්තෝබර් 2017 | නීතිපතිවරයා වෙනුවෙන් පෙනීසිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මාධව තෙන්නකෝන් මහතා අධිකරණයට දන්වා සිටියේ පොලිස් විශේෂ කාර්ය බලකාය, හමුදා නිලධාරීන් සහ බන්ධනාගාර නිලධාරීන් විසින් විමර්ශන පවත්වනු ලබන බවයි. එමෙන්ම පොලිස්පතිවරයා විසින් පත්කරන ලද නිලධාරීන් කණ්ඩායමක් විසින් නව |

| | |
|---|---|
| | පරීක්ෂණයක් පවත්වන බවත් එම පරීක්ෂණයේ කටයුතු 75% අවසන් කර ඇති අතර සම්පූර්ණ විමර්ශනය අවසන් කිරීම සඳහා තවත් සති හතරක් හෝ හයක් සඳහා අවසර ඉල්ලා සිටින ලදි. පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි කේ.එස් රත්නවල මහතා කියා සිටියේ විනිවිදභාවයෙන් යුතුව පරීක්ෂණ පැවැත්විය යුතු බවත්, එහි ප්‍රගතිය අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වන බවත් ය. |
| 2018 වර්ෂයේ මුල්භාගය | සිද්ධිය පිළිබඳ විමර්ශන සිදුකිරීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදි. |
| 2018 මාර්තු 20 | සිය මූලික අයිතිවාසිකම් පෙත්සමේ අවසාන තීරණය ගන්නා තෙක් තමාව අත්අඩංගුවට නොගන්නා ලෙසට වගඋත්තරකරුවන් වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න, පොලිස්පති පූජිත ජයසුන්දර සහ නීතිපතිවරයා වෙත නියෝග කරන අතුරු නියෝගයක් ඉල්ලා පොලිස් පරීක්ෂක රංගජීව විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදි. සිරකරුවන් ඝාතනය කිරීමට සැකපිට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හිටපු කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා සහ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ හිටපු පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව යන දෙදෙනා අත්අඩංගුවට ගෙන රිමාන්ඩ්භාරයේ තබන ලදි. |
| 2018 අප්‍රේල් 24 | මෙම නඩුව පිළිබඳ මහේස්ත්‍රාත් පරීක්ෂණ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලදි. කෝලාහලයක් අවස්ථාවක දී රැඳවියන් ඝාතනය කිරීම සඳහා උපදෙස් දෙන ලද්දේ කවුරුන්ද යන්න අනාවරණය කර ගන්නා ලෙස අධිකරණය විසින් විමර්ශකයන් වෙත නියෝග කරන ලදි. |
| 2018 මැයි 22 | සිද්ධිය වූ දිනයේ දී හමුදා නිලධාරීන් හට බන්ධනාගාරයට ඇතුළු වීමට සහ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග දුන් නිලධාරීන් කවුරුන්ද යන්න අවධානය යොමුකරන ලෙසට කොළඹ අතිරේක මහේස්ත්‍රාත් චමරි වීරසූරිය නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝග කරන ලදි. අධිකරණය එසේ නියෝග ලබා දී තිබුණ ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු විසින් කිසිදු අවස්ථාවක් දී එය අනුගමනය නොකරන ලදි. |
| සැප්තැම්බර් 25 2018 | රංගජීව මහතා ඇප මත නිදහස් කරන ලෙසට අභියචනාධිකරණය නියෝග කළේය. |
| 22 නොවැම්බර් 2018 | රංගජීව මහතා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ ඔහු පූර්වයෙන් සිටි තනතුර වෙත පත්කරන ලදි. |
| දෙසැම්බර් 2019 | මෙම විමර්ශනය පිළිබඳව සමීප අයුරින් වාර්තා කරන ලද මාධ්‍යවේදියකු විසින් සමාජ මාධ්‍ය හරහා රංගජීවගෙන් විවිධ තර්ජන එල්ල වීමෙන් අනතුරුව ඒ පිළිබඳව පැමිණිල්ලක් ගොනු කරන ලදි. |
| 21 ජුනි 2019 | වැලිකඩ බන්ධනාගාරයේ වූ කෝලාහාල සිදුවීම පිළිබඳව නඩුව විභාග කිරීම සඳහා<br>ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් පත්කරන ලෙස නීතිපතිවරයා විසින් අගවිනිසුරුවරයාගෙන් ඉල්ලා සිටින ලදි. |
| 18 ජුලි 2019 | වැලිකඩ බන්ධනාගාර කොලාහාලයේ දී රැඳවියන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට අනුයුක්ත පොලිස් පරීක්ෂක මෝසස් රංගජීව සහ මැගසින් බන්ධනාගාර අධිකාරී ළමාහේවගේ එමිල් රන්ජන් යන දෙදෙනාට එරෙහිව කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල ඉදිරියේ අධිචෝදනා ගොනු කරන ලදි.<br><br>නඩු විභාගයේ දී විනිසුරු මඩුල්ල විසින් ඔවුන් ඇප මත මුදා හැරීමට නියෝග කළ අතර ඔවුන්ට රටින් පිටවීම තහනම් කරන ලදි. මේ අතර බුද්ධි අංශයට |

| | |
|---|---|
| | අනුයුක්තව සිටි තෙවැනි විත්තිකරු වන ඉන්දික සම්පත් අධිකරණයේ පෙනී නොසිටි අතර විත්තිකරු අධිකරණයේ පෙනී නොසිටීම සම්බන්ධයෙන් නඩුව ඉදිරියට ගෙනයාමට පැමිණිල්ල අපේක්ෂා කරන බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නායක මහතා අධිකරණය වෙත දන්වා සිටින ලදි. |
| 30 අගෝස්තු 2019 | මෙම නඩුවේ විත්තිකරු ලෙස නම්කර ඇති බුද්ධි අංශ නිලධාරී ඉන්දික සම්පත් සම්බන්ධයෙන් අධිචෝදනා ගොනු නොකර නඩුව ඉදිරියට ගෙනයන ලෙසට අධිකරණය නියෝග කරන ලදි. ඉන්දික සම්පත් 2018 ජනවාරි මාසයේ සිට මෙරටින් පලාගොස් ඇති අතර ඔහු දැනට එක්සත් රාජධානියේ පදිංචිව සිටින බවට විශ්වාස කෙරේ. මෙම නඩුව විශේෂ මහාධිකණය විසින් ඔක්තෝම්බර් 14 දින නැවත කැඳවීමට නියෝග කරන ලදි. |
| ජනවාරි 2020 | හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා විසින් ඔහුට විරුද්ධව 2012 වැලිකඩ බන්ධනාගාරයේ සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් මහාධිකරණයේ ගොනු කර ඇති නඩුව දේශපාලන පළිගැනීමක් සඳහා සිදුකරන ලද්දක් බව සඳහන් කරමින් දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයාබැලීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරන ලදි. |
| 19 ජුනි 2020 | හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා මහතා දේශපාලන පළිගැනීම් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි ලබාදුනි.<br><br>ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වීම වැළැක්වීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් විසින් වැලිකඩ බන්ධනාගාර සිද්ධිය භාවිතා කිරීමට උත්සාහ කර ඇති බව ඔහු ප්‍රකාශ කරන ලදි.<br><br>සිද්ධිය විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද නම්බුවසම් කමිටුව ස්වාධීනව ක්‍රියාත්මක නොවූ බවත් මෙකී රාජ්‍ය නොවන සංවිධානයන්හි අවශ්‍යතා තවදුරටත් වර්ධනය කිරීමට උත්සාහ කරන ලද බවත් ඔහු ප්‍රකාශ කරන ලදි. මෙම නඩුවේ පළමු විත්තිකරු ඇප මත නිදහස් කරනු ලැබුවද මෙම නඩුවට අදාළව ගෝඨාභය රාජපක්ෂ මහතා වරදකරු කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඔහුව වසරකට වැඩි කාලයක් රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන ලද බව ප්‍රකාශ කරන ලදි. |
| ජුනි 22 2020 | පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ පොලස් පරීක්ෂක නියෝමාල් රංගජීව මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලදි. වැලිකඩ බන්ධනාගාර සිද්ධිය සම්බන්ධයෙන් වූ මුල් සාක්ෂි අතුරුදහන් වී ඇති බව ඔහු ප්‍රකාශ කරන ලදි. ඔහු කියා සිටියේ මෙම සිදුවීම වන කාලය තුළ දී ඔහු වැලිකඩ බන්ධනාගාරගතව සිටින වෙලේසුදා නම් මත්ද්‍රව්‍ය ජාවාරම්කරු අල්ලා ගැනීමේ මෙහෙයුමක නිරත වූ බවයි. මේ හේතුවෙන් ඔහුට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් හට වෙලේසුදා විසින් මරණ තර්ජන කරන ලද බවත් ඒවා ඇතුළත් සංගත තැටි දෙකක් ද ඉදිරිපත් කරන බව ඔහු ප්‍රකාශ කරන ලදි. නිරායුධ රැඳවියන් හට බන්ධනාගාරය තුළ දී පොලීසිය විසින් වෙඩිතබා ඝාතනය කළ බවට ජනමාධ්‍ය හරහා මතයක් ඇති කිරීම සඳහා වූ වෙලේසුදා විසින් දෙන ලද උපදෙස් එක් තැටියක අඩංගු බව ඔහු ප්‍රකාශ කරන ලදි. |
| 26 ජුනි 2020 | වැලිකඩ බන්ධනාගාරයේ සිදුවූ කෝලාහලය සම්බන්ධයෙන් වන නඩුවේ පළමු හා දෙවන වගඋත්තරකරුවන් වන පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව සහ හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා හට ඔවුන්ගේ ඇප නියෝග අවලංගු කර රිමාන්ඩ් භාරයට පත්කරන බවට කොළඹ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල දැඩි ලෙස අනතුරු හඟවන ලදි. |
| 01 ජූලි 2020 | හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලදි. |

| | |
|---|---|
| | 2018 වර්ෂයේ මැදභාගයේ දී බන්ධනාගාරය වෙත පැමිණි මර්වින් සිල්වා මහතා, බන්ධනාගාර රැඳවියන්ගේ මරණ සම්බන්ධයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපකෂ සහ හිටපු ආරක්ෂක ලේකම් හා වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට එරෙහිව අධිකරණය හමුවේ පාපොච්චාරණයක් සිදුකරන ලෙසට තමාට යෝජනා කරන ලද බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම ළමාහේවා මුණගැසීමට අග්‍රාමාත්‍ය කාර්යාලයේ පණිවුඩයක් සමඟින් අශෝක ජයතුංග නම් පුද්ගලයෙක් වැලිකඩ බන්ධනාගාරයට පැමිණි බවත් බන්ධනාගාර සිද්ධිය සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම සඳහන් කරන ලෙස දන්වා එසේ කළහොත් ඔහුට ඉක්මනින් නිදහස් විය හැකි බවත් ප්‍රකාශ කරන ලද බව ඔහු කොමිසම හමුවේ සාක්ෂි දෙමින් කියා සිටියේ ය.<br><br>මහර බන්ධනාගාර අධිකාරී ජගත් චන්දන වීරසිංහ මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හිටපු අමාත්‍ය තලතා අතුකෝරාළ බන්ධනාගාරයේ නිරීක්ෂණ චාරිකාවක් සිදුකරන ලද අවස්ථාවේ දී එමිල් රන්ජන් මහතා නිදහස් කිරීම පිළිබඳව ඇය සමග සාකච්ඡා කළ බව වීරසිංහ මහතා ප්‍රකාශ කරන ලදි. එමෙන්ම වැලිකඩ බන්ධනාගාර සිද්ධියට අදාළව නියෝග දුන් පුද්ගලයින්ගේ නම් සඳහන් කරන ලෙස හිටපු ඇමතිනී තලතා අතුකෝරාළ තමාගෙන් ඉල්ලා සිටින ලද බවත් ඔහු ප්‍රකාශ කරන ලදි.<br><br>චන්දන වීරසිංහ මහතා කියා සිටියේ තමා මේ පිළිබඳව නොදන්නා පිළිබඳව දැනුම් දුන් විට ඇමතිවරිය විසින් අධිකරණයේ පෙනී සිටීමෙන් අනතුරුව මෙම නඩුව සඳහා අධිකරණය ඉදිරියේ පෙනී සිටීමෙන් පසුව නිදහස් විය යුතු බවයි. ඔහු කියා සිටියේ ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව පරිසරයක් පැවති බැවින් සිද්ධියට නියෝග කළ පුද්ගලයින්ගේ නම් ලබාදෙන ලෙසට අමාත්‍යවරිය ඉල්ලීමක් කරන ලද්දේ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම සිද්ධියට සම්බන්ධ කරගැනීමට බව පෙන්වා දෙන ලදි. බන්ධනාගාර අධිකාරීවරුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකු වූ එමිල් රන්ජන් මහතාගේ නිර්දෝෂීභාවය පිළිබඳව ඔහු නායකත්වය දෙන ලද බන්ධනාගාර අධිකාරීවරුන් විසින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වෙත ලිපයක් යවා ඇති බව ඔහු ප්‍රකාශ කරන ලදි.<br><br>බන්දුල අතපත්තු කමිටුවේ සාමාජික, හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ගුණසේන තේනබදු මහතා සිද්ධිය පිළිබඳ සොයාබලා විමර්ශනය කරන ලෙස පත්කරන ලදි. කමිටුව විසින් නිර්දේශ 17 ක් ඇතුළත් පිටු 540 ක වාර්තාවක් ඉදිරිපත් කළ බව ඔහු පැවසුයේ ය. සිද්ධියෙන් දින තුනකට පසු එවකට අමාත්‍ය චන්ද්‍රසිරි ගජධීරගේ උපදෙස් පරිදි මෙම කමිටුව අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද බව ඔහු ප්‍රකාශ කරන ලදි. කෙසේ වෙතත්, එම කමිටු වාර්තාව සළකා නොගෙන යහපාලනය රජය විසින් වෙනත් කමිටුවක් පත්කිරීම සැක සහිත බව ඔහු ප්‍රකාශ කරන ලදි. යහපාලන රජය තුළ රාජ්‍ය නිලධාරීන්ට එරෙහි ක්‍රියාදාමයේ එක් කොටසක් වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව කටයුතු කිරීම මෙහි අරමුණ බව ඔහු පෙන්වා දෙන ලදි. |
| 07 ජූලි 2020 | පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ පොලස් පරීක්ෂක නියෝමාල් රංගජීව මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලදි.<br><br>බන්ධනාගාරයේ ගැටුමක් ඇති වූ දිනයේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ඔහුව බන්ධනාගාරය වෙත යැවූ බව පිළිගන්නේ නම්, |

| | |
|---|---|
| | සියලු චෝදනා වලින් ඔහුව නිදහස් වන බවට හිටපු නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතා තමාට සහතික වූ බව රංගජීව මහතා ප්‍රකාශ කරන ලදි. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ ඇතැම් දේශපාලන නියෝජිතයන්ගේ ඉල්ලීම පරිදි බොරු චෝදනා නගමින් ඔහුගේ සේවය අත්හිටුවීමට උත්සාහ ගන්නා ලද බව ඔහු ප්‍රකාශ කරන ලදි. |
| 20 අගෝස්තු 2020 | හිටපු පොලස් පරීක්ෂක නියෝමාල් රංගජීව මහතා විසින් සිදුකරන ලද පැමිණිල්ල අනුව නිකුත් කරන ලද සිතාසි මත හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර, හිටපු අමාත්‍ය ඩී.එම්. ස්වාමිනාදන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් අධිකාරී චිත්‍රානන්ද වික්‍රමසේකර සහ තවත් කිහිප දෙනෙකු දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලදි. |
| 24 අගෝස්තු 2020 | හිටපු ඇමතිනී තලතා අතුකෝරාළ සහ පොලිස්පති පූජිත ජයසුන්දර මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලදි. |
| 24 සැප්තැම්බර් 2020 | හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාවේ පෙනී සිටිමින් කියා සිටියේ හිටපු බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ අමාත්‍ය ඩී. එම්. ස්වාමිනාදන් මහතා විසින් 2012 වර්ෂයේ සිදු වූ වැලිකඩ බන්ධනාගාර සිද්ධිය සම්බන්ධයෙන් නැවත පරීක්ෂණ ආරම්භ කිරිමට ඔහුට නියෝග කරන ලද බවයි. ඔහුගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහු පෙන්වා දෙන ලද්දේ එකී කාලසීමාව සැළකිල්ලට ගනිමින්, එම කාලයේ පැවැත්විමට තිබූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ සැසිවාරයට අනුකූලව එකී උපදෙස් ලබා දී ඇති බවයි. |

| 10. රතුපස්වල වෙඩිතැබීම 2013 | |
|---|---|
| 2013 අගෝස්තු 01 | මෙම සිදුවීමේ දී ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, වැලිවේරිය, රතුපස්වල ගමෙහි පිහිටා තිබූ කර්මාන්ත ශාලාවක් මගින් ඇසිඩ් පරිසරයට මුදාහැරීම හේතුවෙන් පානීය ජලය දූෂණය වීම සම්බන්ධව විරෝධය පළකරන ලද නිරායුධ සිවිල් පුරවැසියන් වෙත 58 වන සේනාංකයේ හා කමාන්ඩෝ රෙජිමේන්තුවේ හමුදා නිලධාරීන් විසින් ප්‍රහාරයක් එල්ල කරන ලදි. සිවිල් වැසියන්ට වෙඩි තැබීමට ප්‍රථමයෙන් හමුදාව විසින් එකී ප්‍රදේශයේ සිටි මාධ්‍යවේදීන් බලහත්කාරයෙන් ඉවත් කරන ලදි. වෙඩි තැබීමෙන් පසු සිවිල් වැසියන් තිදෙනෙකු මිය ගොස් 30 දෙනෙකුට වැඩි පිරිසක් තුවාල ලැබූහ. |
| 2013 අගෝස්තු 03 - 2013 අගෝස්තු 06 | සිවිල් වැසියන්ට පහරදීම සහ 19 හැවිරිදි පිරමි දරුවකු හා 17 හැවිරිදි පිරිමි දරුවකු ඇතුළුව විරෝධතාකරුවන් තිදෙනෙකු වැලිවේරියේ දී ඝාතනය කිරීම ඇතුළත්ව හමුදාවට එරෙහි චෝදනා විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා හමුදාව පස් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කරන ලදි. ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සහ එක්සත් ජාතික පක්ෂය මෙම සිද්ධිය සම්බන්ධව ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා සිටින ලදි. සිද්ධිය පිළිබඳ සොයාබැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණ කොමිසමක් ප්‍රකාශයට පත්කරන ලදි. |
| 2013 අගෝස්තු 06 | ලංකා ගුරු සංගමය සහ ස්වාධීන අධ්‍යාපන සේවක සංගමය විසින් පසුගිය සතියේ වැලිවේරියේ දී හමුදාව විසින් පාසල් ළමුන් දෙදෙනෙකු හට වෙඩිතබා ඝාතනය කිරීමට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළහ. |

| | |
|---|---|
| 2013 අගෝස්තු 09 | සිද්ධිය පිළිබඳ වාර්තා කරනු ලබන මාධ්‍ය වෙත හමුදා බලපෑම් සිදුකිරීම. |
| 2013 අගෝස්තු 18 | සිද්ධිය පිළිබඳව වාර්තා කරනු ලබන මාධ්‍ය වෙත හමුදාව විසින් දිගින් දිගට සිදුකරනු ලබන බියවැද්දීම් |
| 2013 අගෝස්තු 23 | පුද්ගලයන් තිදෙනෙකු ඝාතනයට ලක් වූ වැලිවේරිය සිද්ධිය සම්බන්ධයෙන් යුධ හමුදාව විසින් සිදුකරන ලද විමර්ශන පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය දැඩි ලෙස විරෝධය පළකරන ලදි. එමෙන්ම මෙම සිද්ධියේ දී සිදුවූ මනුෂ්‍ය ඝාතන ත්‍රිත්වයට හමුදාව වගකිවයුතු බවට චෝදනා කරමින් හමුදාව විසින් පවත්වන ලද සියලුම පරීක්ෂණ අත්හිටුවන ලෙසට ඔවුන් විසින් ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් ටිකිරි ජයතිලක මහතාගෙන් ඔවුන් ඉල්ලා සිටින ලදි. |
| 2013 අගෝස්තු මස 21 | වැලිවේරිය වෙඩි තැබීම සම්බන්ධයෙන් වූ හමුදා අධිකරණය සිය වාර්තාව හමුදාපති වෙත ඉදිරපත් කරන ලදි. නමුත් එකී වාර්තාව කිසිදිනක ප්‍රසිද්ධ නොකරන ලදි. |
| 2013 අගෝස්තු 28 | වැලිවේරිය විරෝධතාවය අතරතුර සිදු වූ මරණ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය ගම්පහ මහේස්ත්‍රාත් ටිකිරි කේ. ජයතිලක මහතා විසින් සිදුකරන ලදි.<br><br>වැලිවේරිය ඝාතනවලට සම්බන්ධ බ්‍රිගේඩියර්වරයෙකු හා හමුදාවේ ලුතිනන් කරනල්වරුන්ගේ සේවය හමුදාපති විසින් අත්හිටුවන ලදි. හමුදා නීතිය උල්ලංඝණය කරන ලද නිලධාරීන්ට එරෙහිව යුධ අධිකරණයේ දී තීරණයක් ගනු ලබන බව හමුදාව විසින් ප්‍රකාශයට පත්කරන ලදි. |
| 2013 සැප්තැම්බර් 18 | රතුපස්වල සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි ලබාදුන් සාක්ෂිකරුවන්ව කොළඹ අපරාධ කොට්ඨාශයට (CCD) අනුයුක්ත නිලධාරීන් විසින් බියගන්වන ලද බවට ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) විසින් චෝදනා කරන ලදි. |
| 2014 මැයි | වෙඩිතැබීමට සම්බන්ධ වූ හමුදා නිලධාරීන්ගේ සේවය අත්හිටුවන ලදි. රතුස්වල වෙඩිතැබීමට සම්බන්ධ හමුදා බලඇණියේ අණදුන් නිලධාරියා වූ බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන තුර්කි තානාපති කාර්යාලයේ හමුදා ප්‍රධානියා වශයෙන් පත්කරන ලදි. මෙම රතුපස්වල සිදුවීමෙන් පසුව බ්‍රිගේඩියර් දේශප්‍රියගේ වැඩ තහනමට ලක්ව ඇති බව රජය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබුණි. |
| 2016 මාර්තු | හිටපු පොලිස්පති එන්. කේ ඉලංගකෝන් මහතා විසින් මෙම සිද්ධියේ විමර්ශන කටයුතු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදි. |
| 2017 මාර්තු 24 | වැලිවේරිය රතුපස්වල දී වූ වෙඩි තැබීමේ සිද්ධියට සම්බන්ධ හමුදා හටයන් තිදෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලදි. කෙසේ නමුත් හමුදා ප්‍රකාශක රොෂාන් සෙනෙවිරත්න මහතා පැවසූයේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තන්ට විරුද්ධව මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි. |
| 2017 අප්‍රේල් | රජය විසින් 2013 වර්ෂයේ හමුදාව විසින් වෙඩිතබන ලද පවුල් 33 ක් සඳහා මිලියන 4.8 ක වන්දි මුදල් ලබා දී ඇති අතර වෙඩිතබා ඝාතනය කරන ලද තරුණයන් තිදෙනාගේ පවුල් සඳහා එක් පවුලකට මිලයනය බැගින් වූ වන්දි ප්‍රදානය කර ඇත. |
| 2017 අප්‍රේල් 03 | අගතියට පත් වූ පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ මහතා පෙන්වාදෙන ලද්දේ මෙම සිද්ධිය සඳහා අත්අඩංගුවට ගන්නා ලද්දේ පහළ නිලධාරීන් බවත් මෙකී වෙඩිතැබීම සඳහා අණදුන් ඉහළ පෙළේ හමුදා නිලධාරීන් අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග |

| | |
|---|---|
| | කරන ලෙස ඉල්ලා සිටින ලදි. |
| 2017 අප්‍රේල් 25 | අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් රතුපස්වල වෙඩිතැබීමේ සිද්ධියට සම්බන්ධ වූ බවට සැකපිට බ්‍රිගේඩියර් අනුර දේශප්‍රිය මහතා අත්අඩංගුවට ගනු ලැබීය. |
| 2019 ජූලි 11 | රතුපස්වල වෙඩිතැබීම සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය සභාවක් පත්කරන ලෙසට නීතිපතිවරයා විසින් අගවිනිසුරුවරයාගෙන් ඉල්ලා සිටින ලදි. |
| 2019 සැප්තැම්බර් 11 | රතුපස්වල වෙඩි තැබීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන්ට එරෙහිව නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කරන ලදි. |

.